# කෘෂිකර්මය

## සමස්ත උපනතීන්

1989 වර්ෂයේ දී දැඩි පසුබෑමකට ලක් වූ කෘෂිකාර්මික අංශය, 1990 වර්ෂය තුළ දී සැළකිය යුතු ප්‍රගතියක් ලැබිය. යහපත් කාලගුණික තත්ත්වයන් සහ රටෙහි බොහෝ ප්‍රදේශවල අභ්‍යන්තර කලබල අඩුවීම මෙම සතුටුදායක ක්‍රියාකාරිත්වයට දායක වූ ප්‍රධාන සාධක අතර විය. 1990 වර්ෂය තුළදී තේ නිෂ්පාදනය සියයට 13 කින් සැළකිය යුතු ලෙස වැඩි වී මෙතෙක් වාර්තා ගතවී ඇති වැඩිම නිෂ්පාදන මට්ටම කරා ළඟා විය. රබර් සහ පොල් නිෂ්පාදනය පිළිවෙලින් සියයට 3 කින් සහ සියයට 2 කින් සුළු වශයෙන් වැඩි වූ අතර, වී නිෂ්පාදනය සියයට 23 ක තියුණු වැඩිවීමක් වාර්තා කරන ලදී. සීනි නිෂ්පාදනය සියයට 6 ක වර්ධනයක් පෙන්විය. අතිරේක ආහාර බෝග සහ සුළු අපනයන බෝග අංශයන්හි සතුටුදායක නිෂ්පාදන ක්‍රියාකාරිත්වයද කෘෂිකාර්මික අංශයේ සැළකිය යුතු ප්‍රගතියට දායක විය.

### ප්‍රධාන අපනයන බෝග


#### තේ

පසුගිය දස වසර තුළදී කිලෝ ග්‍රෑම් දශ ලක්ෂ 205 ක සාමාන්‍ය නිෂ්පාදන මට්ටමක් ආශ්‍රිතව උච්චාවචනය වූ තේ නිෂ්පාදනය, 1990 වර්ෂයේදී සැළකිය යුතු වර්ධනයක් දක්වමින් මෙතෙක් වාර්තා ගත වී ඇති උපරිම නිෂ්පාදන මට්ටම වන කිලෝ ග්‍රෑම් දශ ලක්ෂ 233 කරා ළඟා විය. මෙම සැළකිය යුතු වැඩිවීමට, යහපත් කාලගුණික තත්ත්වයන් සහ සිවිල් කලබල අඩුවීම මූලික වශයෙන් හේතු විය. පහත් බිම් ප්‍රදේශවල තේ වගාවන්හි නිෂ්පාදනය සම්පූර්ණයෙන් යථා තත්ත්වයට පත්වීම සහ තේ මිළ ගණන් ඉහළ මිළ මට්ටමක පැවතීමේ ප්‍රතිඵලයක් වශයෙන් වඩාත් සුදුසු වගා ක්‍රම උපයෝගී කර ගැනීම නිෂ්පාදනය වැඩිවීමට දායක වී ඇත. තේ නිෂ්පාදනය යථා තත්ත්වයට පත්වීම වගා බිම් කාණ්ඩ තුනෙහිම පැහැදිලිව දක්නට ලැබුණද, මෙය වඩාත් පිළිබිඹු වුයේ, සියයට 27 ක නිෂ්පාදනයේ වැඩි වීමක් දැක්වූ පහත් බිම් ප්‍රදේශවල තේ වගාවන්හිය. 1990 වර්ෂයේ දී පහත් බිම් තේ නිෂ්පාදනය මෙතෙක් වාර්තාගත වී ඇති ඉහළම නිෂ්පාදන මට්ටම වූ කිලෝ ග්‍රෑම් දශ ලක්ෂ 105 ක් විය. උස් සහ මැදි බිම් තේ නිෂ්පාදන පිළිවෙලින් සියයට 3 ක සහ සියයට 4 ක වැඩිවීම් වාර්තා කරන ලදී. 'සම්ප්‍රදායික' තේ නිෂ්පාදනය (එල්.ටී.පී. තේ ඇතුළත්ව) කිලෝ ග්‍රෑම් දශ ලක්ෂ 228 දක්වා සියයට 12 කින් ඉහළ නැගුණි. සී.ටී.සී. (කපා, ඉරා අඹරන ලද) තේ නිෂ්පාදනය 1990 වර්ෂයේ දී කිලෝ ග්‍රෑම් දශ ලක්ෂ 5.7 දක්වා සියයට 35 කින් වැඩි වී මුළු නිෂ්පාදනයෙන් සියයට 2 ට දායක විය.

1990 වර්ෂයේදී ජනතා වතු සංවර්ධන මණ්ඩලයන්හි සහ ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාවන්හි ඒකාබද්ධ තේ නිෂ්පාදනය (මිළදී ගනු ලැබූ අමු තේ දළු වලින් නිපදවන ලද තේ ද ඇතුළත්ව) කිලෝ ග්‍රෑම් දශ ලක්ෂ 139 දක්වා සියයට 5 කින් පමණ ඉහළ නැගුණි. එහෙයින්, 1989 දී රටෙහි සමස්ත තේ නිෂ්පාදනයෙන් සියයට 64 ක් වූ රාජ්‍ය අංශයට හිමි සාපේක්ෂ කොටස 1990 දී සියයට 60 දක්වා පහත වැටුණි. ජනතා වතු සංවර්ධන මණ්ඩලයන් මගින් පාලනය වන වතුවල තේ නිෂ්පාදනය සියයට 4 කින් වැඩි වී කිලෝ ග්‍රෑම් දශ ලක්ෂ 72 ක් වූ අතර, ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාවන්ට අයත් වතුවල තේ නිෂ්පාදනය කිලෝ ග්‍රෑම් දශ ලක්ෂ 67 දක්වා සියයට 5 කින් ඉහළ නැගුණි. 1990 දී, පෞද්ගලික අංශයෙහි තේ නිෂ්පාදනය සියයට 27 කින් සැළකිය යුතු ලෙස වැඩි වී කිලෝ ග්‍රෑම් දශ ලක්ෂ 94 ක් විය. පෞද්ගලික අංශය විසින් නෙලන ලද අමු දළු වලින්, රාජ්‍ය අංශයෙහි වැවිලි සංස්ථාවන් දෙක විසින් නිෂ්පාදනය කරන ලද තේ, පෞද්ගලික අංශයෙහි තේ නිෂ්පාදනයට ඇතුළත් කළ විට, සමස්ත තේ නිෂ්පාදනයෙන් පෞද්ගලික අංශයට හිමිවන කොටස සියයට 44 සිට සියයට 49 දක්වා වැඩි විය.

තේ වගා අංශයට නිකුත් කරන ලද පොහොර ප්‍රමාණය 1990 වර්ෂයේදී මෙට්‍රික් ටොන් 134,287 දක්වා සියයට 5 කින් ඉහළ නැගුණි. කෙසේ වුවද, 1990 වසරේ දී, ජනතා වතු සංවර්ධන මණ්ඩලයන් මගින් පාලනය වන තේ වතුවල පොහොර භාවිතය මෙට්‍රික් ටොන් 38,599 දක්වා සියයට 11 කින් පහත වැටුණු අතර, ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාවන්ට අයත් තේ වතුවල

## ප්‍රධාන කෘෂිකාර්මික බෝග නිෂ්පාදනය




ශ්‍රී ලංකා මහ බැංකුව.

පොහොර භාවිතය සියයට 19 කින් අඩු වී මෙට්‍රික් ටොන් 22,209 ක් විය. එසේ වුවද, පෞද්ගලික තේ වතුවල පොහොර යෙදීම, 1990 දී සැළකිය යුතු ලෙස වැඩිවිය. ඉහළ තේ මිළ ගණන් පෞද්ගලික තේ වතුවල පොහොර වැඩියෙන් යෙදීමට උනන්දු කරවූවා විය හැකිය.

### 1.9 සංඛ්‍යා සටහන

### තේ වගා අංශය පිළිබඳ සංඛ්‍යා 1988 - 1990

| ශීර්ෂය | ඒකකය | 1988 | 1989 (අ) | 1990 (ආ) |
|---|---|---|---|---|
| 1. නිෂ්පාදනය .. | කිලෝ ග්‍රෑම් දශ ලක්ෂ | 226·9 | 207·0 | 233·2 |
| 1.1 උස් බිම් .. | ,, | 76·8 | 74·1 | 76·1 |
| 1.2 මැදි බිම් .. | ,, | 54·3 | 50·0 | 51·9 |
| 1.3 පහත් බිම් .. | ,, | 95·8 | 82·9 | 105·1 |
| 2. තේ වගාව යටතේ ලියාපදිංචි කළ බිම් ප්‍රමාණය .. | හෙක්ටයාර දහස් | 222 | 221 | 222 |
| 3. පොහොර නිකුතුව .. | මෙට්‍රික් ටොන් දහස් | 138·0 | 127·9 | 134·3 |
| 4. නැවත වගා කිරීම .. | හෙක්ටයාර | 1,592 | 1,551 | 1,586 |
| 5. මිළ .. | | | | |
| 5.1 කොළඹ (ශුද්ධ) .. | කි. ග්‍රෑ./රුපියල් | 41·59 | 52·16 | 65·72 |
| 5.2 අපනයන (නැ.වි.ස.) .. | ,, | 55·95 | 66·91 | 91·78 |
| 6. නිෂ්පාදන වියදම .. | ,, | 43·98 | 49·70 | 57·65 |
| 7. අපනයන .. | කිලෝ ග්‍රෑම් දශ ලක්ෂ | 219·8 | 204·2 | 216·0 |
| 8. අපනයන ඉපැයුම් .. | රුපියල් දශ ලක්ෂ (ඩොලර් දශ ලක්ෂ) | 12,298·7 (288) | 13,663·9 (296) | 19,823·3 (364) |
| 9. එකතු කළ වටිනාකම දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් වශයෙන් (ඇ) .. | | 5·1 | 4·5 | 4·4 |

(අ) සංශෝධිත.
(ආ) තාවකාලික.
(ඇ) වගා කිරීම සහ සැකසුම් කටයුතුවල පමණි.

මූලයන් : ශ්‍රී ලංකා තේ මණ්ඩලය; ජාතික පොහොර ලේකම් කාර්යාලය; ශ්‍රී ලංකා මහ බැංකුව.

1990 වර්ෂයේ දී ජනතා වතු සංවර්ධන මණ්ඩලයන්ට අයත් වතුවල සාමාන්‍ය ඵලදාව සියයට 6 කින් වැඩි වී හෙක්ටයාරයකට කිලෝ ග්‍රෑම් 1,315 ක් වූ අතර, ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාවන් මගින් පාලනය වන වතුවල සාමාන්‍ය ඵලදාව හෙක්ටයාරයකට කිලෝ ග්‍රෑම් 1,136 දක්වා සියයට 2 කින් පමණ වැඩි විය.

1990 වසරේදී තේ වගාව යටතේ ලියාපදිංචි කර ඇති මුළු බිම් ප්‍රමාණය හෙක්ටයාර 221,758 ක් ලෙස ඇස්තමේන්තු කර ඇති අතර, මෙය 1989 වසර සමග සැසඳීමේදී හෙක්ටයාර 648 ක සුළු වැඩිවීමකි. මෙම වැඩිවීම සම්පූර්ණයෙන්ම පෞද්ගලික අංශයෙහි දක්නට ලැබුණි. ජනතා වතු සංවර්ධන මණ්ඩලයන්ට සහ ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාවන්ට අයත් තේ වගා කරන ලද බිම් ප්‍රමාණයන් 1990 දී, පිළිවෙලින් හෙක්ටයාර 56,491 සහ හෙක්ටයාර 50,705 දක්වා සුළු වශයෙන් අඩු විය. ජනතා වතු සංවර්ධන මණ්ඩලයන්ට අයත් තේ දළු නෙලාගනු ලැබූ බිම් ප්‍රමාණය 1990 දී සුළු වශයෙන් වැඩි වී හෙක්ටයාර 51,990 ක් වූ අතර, ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාවන්ට හිමි වතුවල තේ දළු නෙළා ගනු ලැබූ බිම් ප්‍රමාණය හෙක්ටයාර 45,923 දක්වා සුළු වශයෙන් පහත වැටුණි.

නැවත වගා කරන ලද මුළු බිම් ප්‍රමාණය, 1990 වර්ෂයේ දී සියයට 2 ක සුළු වැඩිවීමක් වාර්තා කරමින්, හෙක්ටයාර 1,586 ක් විය. ජනතා වතු සංවර්ධන මණ්ඩලයන් සහ පෞද්ගලික අංශය විසින් 1990 දී නැවත වගා කරන ලද බිම් ප්‍රමාණයන් පිළිවෙලින් හෙක්ටයාර 611 සහ හෙක්ටයාර 362 දක්වා සියයට 3 කින් සහ සියයට 12 කින් වැඩි වූ අතර, ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාවන් මගින් නැවත වගා කරන ලද බිම් ප්‍රමාණය සියයට 3 කින් පහත වැටෙමින් හෙක්ටයාර 613 ක් විය.

1989 වර්ෂය සමඟ සසඳා බලන කල, 1990 වර්ෂය තුළදී අළුතින් තේ වගා කරන ලද බිම් ප්‍රමාණය හෙක්ටයාර 575 ක් හෙවත් සියයට 49 ක වැඩිවීමක් දක්වමින් හෙක්ටයාර 1,753 ක් විය. මෙම වැඩිවීමට, පසුගිය වසරට වඩා සියයට 63 ක වැඩිවීමක් දක්වමින් හෙක්ටයාර 1,647 ක් වූ පෞද්ගලික අංශය විසින් අළුතින් තේ වගා කරන ලද බිම් ප්‍රමාණය, සම්පූර්ණයෙන්ම දයක විය. කුඩා වතු හිමියන් ප්‍රමුඛස්ථානයක් ගන්නා පහත් බිම් ප්‍රදේශවල, අළුත් වගාවන් ප්‍රධාන වශයෙන් දක්නට ලැබුණි. ඉහළ තේ මිළ ගණන් සහ යහපත් කාලගුණික තත්ත්වයන් පැවතීම මෙන්ම ආසියානු සංවර්ධන බැංකුව මගින් ආධාර දෙනු ලබන කුඩා තේ ඉඩම් හිමි සංවර්ධන ව්‍යාපෘතිය යටතේ වගා කටයුතු වැඩිවීමත්, පෞද්ගලික අංශයෙහි අළුතින් වගා කිරීම් කටයුතු වඩා ඉහළ මට්ටමක පැවතීමට දායක වූ සාධක විය. ජනතා වතු සංවර්ධන මණ්ඩලයන් විසින් අළුතින් වගා කරනු ලැබූ බිම් ප්‍රමාණය 1989 දී හෙක්ටයාර 56 සිට 1990 දී හෙක්ටයාර 45 දක්වා පහත වැටුණු අතර, ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාවන් විසින් අළුතින් වගා කළ බිම් ප්‍රමාණය 1989 දී හෙක්ටයාර 111 සිට 1990 දී හෙක්ටයාර 61 දක්වා අඩු විය.

තේ, අතුරු බෝගයක් ලෙස රබර් වගා කර ඇති බිම්වල වගා කිරීම සඳහා හෙක්ටයාරයකට ආසන්න වශයෙන් රුපියල් 46,000 ක ගෙවීමක් කරන නව සහනාධාර යෝජනා ක්‍රමයක් 1990 දී ආරම්භ කරන ලදී. විවිධ වගා කටයුතු සඳහා දෙනු ලැබූ සහනාධාර අනුපාතිකයන් 1990 වසර තුලදී නොවෙනස්ව පැවතුණි. කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය විසින් නොයෙක් යෝජනා-ක්‍රම යටතේ, දෙනු ලැබූ මුළු සහනාධාර ප්‍රමාණය 1989 දී රුපියල් දශ ලක්ෂ 71 සිට 1990 දී රුපියල් දශ ලක්ෂ 79 දක්වා වැඩිවිය. කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය මගින් කුඩා වතු හිමියන්ට සහනාධාර, අමුද්‍රව්‍ය, උපදේශක සහ ව්‍යාප්ති සේවා වැනි උපකාරක සේවා නොකඩවා සපයනු ලැබීය. පෞද්ගලික වාණිජ්‍යමය පැල තවාන් සහ කුඩා වතු හිමියන්ගේ පැල තවාන් පිහිටුවීම දිරිමත් කිරීමේ අදහසින්, කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය විසින් ඒ සඳහා අවශ්‍ය විවිධ අමුද්‍රව්‍ය සහනදායි මිලකට ලබා දෙන ලදී. ඌව, සබරගමුව, ගාල්ල සහ මාතර යන ප්‍රදේශයන්හි කුඩා තේ වතු සංවර්ධන සමිති පිහිටුවීමට හැකිවන ලෙස නව ව්‍යවස්ථාවක් සම්පාදනය කරන ලදී.

කුඩා තේ වතු මෙන්ම පෞද්ගලික අංශයෙහි කම්හල්වල ඵලදායිතාවය දියුණු කිරීම සහ වඩා සඵලදායි ව්‍යාප්ති සේවාවක් තහවුරු කිරීමේ අදහසින්, ආසියානු සංවර්ධන බැංකුවේ ආධාර ලබන කුඩා තේ ඉඩම් හිමි සංවර්ධන ව්‍යාපෘතිය 1990 දී ආරම්භ කරන ලදී. කුඩා තේ ඉඩම් හිමි සංවර්ධන ව්‍යාපෘතිය යටතේ, නැවත වගා කටයුතු සඳහා 1990 දී, බලපත්‍ර 2,438 ක් නිකුත් කරන ලදී. මෙම ව්‍යාපෘතිය යටතේ තේ අළුතින් වගාකිරීමට ඉලක්කගත කරන ලද බිම් ප්‍රමාණය හෙක්ටයාර 64 කින් ඉක්මවමින් 1990 වර්ෂයේ දී අළුතින් වගා කරන ලද බිම් ප්‍රමාණය හෙක්ටයාර 624 ක් විය.

සකස් කරන ලද තේ කිලෝ ග්‍රෑමයක සාමාන්‍ය නිෂ්පාදන පිරිවැය 1990 වර්ෂයෙහිදී කිලෝ ග්‍රෑමයකට රුපියල් 57.65 දක්වා සියයට 16 කින් පමණ වැඩිවීයයි ඇස්තමේන්තු කර ඇත. මෙම වැඩිවීමට, ඉහළ පොහොර මිළ ගණන් සහ වැඩිවූ වැටුප් පිරිවැය විශාල වශයෙන් හේතු විය.

1989 වර්ෂයේදී කොළඹ තේ වෙන්දේසියෙහි ඉහළ නැඟුණු තේ මිළ ගණන්, වැඩි වූ ඉල්ලුම සහ ලෝක වෙළෙඳ පොලෙහි තේ සැපයුම අඩුවීමේ ප්‍රතිඵලයක් ලෙස වෙළෙඳ පොල තත්ත්වයන් සතුටුදායක වූ බව පිළිබිඹු කරමින්, 1990 වර්ෂයේදී තවදුරටත් වැඩි විය. කොළඹ තේ වෙන්දේසියෙහි සියළුම තේ වර්ගවල සාමාන්‍ය දළ මිළ 1989 දී කිලෝ ග්‍රෑමයකට රුපියල් 54.61 සිට 1990 දී කිලෝ ග්‍රෑමයකට රුපියල් 70.97 දක්වා සියයට 30 කින් සැළකිය යුතු ලෙස ඉහළ නැඟුණි. 1990 දී, තේ සඳහා ලැබුණු සාමාන්‍ය අපනයන (නැ.වි.ස.) මිළ ද, සියයට 37 කින් වැඩි වී කිලෝ ග්‍රෑමයකට රුපියල් 91.78 ක් විය.

තේ සඳහා වටිනාකම මත අය කරන අලෙවි බද්ද, කිලෝ ග්‍රෑමයකට රුපියල් 15 ක් වන උපරිම බදු අනුපාතිකයකට යටත්ව, අලෙවි බද්ද සඳහා වන සීමා මිළ කිලෝ ග්‍රෑමයකට රුපියල් 60 සිට කිලෝ ග්‍රෑමයකට රුපියල් 65 දක්වා වැඩි වන ලෙස, 1990 ජූලි මාසයේදී සංශෝධනය කරන ලදී. 1990 අප්‍රේල් මස සිට ක්‍රියාත්මක වන පරිදි, තේ සඳහා වන සෙස් බද්ද කිලෝ ග්‍රෑමයකට රුපියල් 3.50 දක්වා රුපියල් 1.50 කින් තවදුරටත් වැඩි කරන ලදී. මෙම වැඩිවීමෙන් කිලෝ ග්‍රෑමයකට රුපියල් 1 ක මුදල් ප්‍රමාණයක්, තේ ස්ථායිකරණ අරමුදලෙහි මූල්‍ය සම්පත් වැඩිකිරීම සඳහා වෙන් කරන ලදී.

## රබර්

1990 වර්ෂයේ රබර් නිෂ්පාදනය කිලෝ ග්‍රෑම් දශ ලක්ෂ 114 ලෙස තාවකාලිකව ගණන් බලා ඇති අතර, මෙය පසුගිය වර්ෂය සමග සසඳන කල සියයට 3 ක වැඩි වීමක් පෙන්නුම් කරයි. කිරි කපන ලද බිම් ප්‍රමාණයෙහි සුළු පහත වැටීම සලකා බලන කල, නිෂ්පාදන මට්ටම වැඩිවීමට, වර්ෂය තුලදී ලබා ගතහැකි වූ ඉහළ සාමාන්‍ය එලදාව සම්පූර්ණයෙන්ම හේතු විය.

රබර් නිෂ්පාදනය වැඩිවීම සම්පූර්ණයෙන්ම, පසුගිය වර්ෂයට වඩා සියයට 13 ක වැඩි වීමක් පෙන්වමින් කිලෝ ග්‍රෑම් දශ ලක්ෂ 39 වූ රාජ්‍ය අංශයෙහි රබර් නිෂ්පාදනයෙහි පිළිබිඹු විය. ජනතා වතු සංවර්ධන මණ්ඩලයන් සහ ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාවන් සතු වතුවල රබර් නිෂ්පාදනය 1990 දී සියයට 13 බැගින් වැඩි වී, පිළිවෙලින් කිලෝ ග්‍රෑම් දශ ලක්ෂ 17 ක් සහ කිලෝ ග්‍රෑම් දශ ලක්ෂ 22 ක් වූ අතර, එම සංස්ථා දෙකෙහි ඒකාබද්ධ නිෂ්පාදනය සමස්ත රබර් නිෂ්පාදනයෙන් සියයට 34 ක් විය. සාමාන්‍ය එලදාව සුළු වශයෙන් වැඩි වුවද, කිරි කපන ලද බිම් ප්‍රමාණය නොකඩවා අඩුවූ බව පිළිබිඹු කරමින් පෞද්ගලික අංශයෙහි නිෂ්පාදනය සියයට 2 කින් අඩු වී කිලෝ ග්‍රෑම් දශ ලක්ෂ 75 ක් විය.

සාපේක්ෂව යහපත් කාලගුණික තත්ත්වයන් පැවැතීමත්, සිවිල් කලබල අඩුවීමත් හේතුවෙන් 1990 වර්ෂයේදී හෙක්ටයාරයක සාමාන්‍ය එලදාව පසුගිය වර්ෂය සමග සසඳන කල සියයට 4 කින් වැඩිවී කිලෝ ග්‍රෑම් 779 ක් විය. ජනතා වතු සංවර්ධන මණ්ඩලයන්ට සහ ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාවන්ට අයත් වතුවල සාමාන්‍ය එලදව 1990 වර්ෂයෙහිදී පිළිවෙලින් හෙක්ටයාරයකට කිලෝ ග්‍රෑම් 998 ක් හා හෙක්ටයාරයකට කිලෝ ග්‍රෑම් 894 ක් දක්වා සියයට 14 කින් සහ සියයට 16 කින් ඉහළ නැඟුණි.

විමසුමට භාජනය වන වර්ෂය තුලදී එලදායිතාවය වැඩි කිරීමේ උපක්‍රමයක් ලෙස ඉහළ එලදාවක් ලබාදෙන 'ක්ලෝන' වර්ග නැවත වගා කිරීමට වැඩි අවධානයක් යොමු කරන ලදී. මෙය ක්‍රියාත්මක කිරීම සඳහා 'පී.බී. 86' නැමති ක්ලෝනය රාජ්‍ය අංශයේ වතුවල 1990 වර්ෂයෙන් පසු වගා කිරීම අත්හිටුවන ලදී.

රබර් වගාව යටතේ ලියාපදිංචි කරන ලද මුළු බිම් ප්‍රමාණය 1990 වර්ෂයෙහි දී හෙක්ටයාර 199,048 දක්වා සුළු වශයෙන් පහත වැටුණි. ජනතා වතු සංවර්ධන මණ්ඩලයන් සහ රාජ්‍ය වැවිලි සංස්ථාවන් යටතේ තිබුණු ඒකාබද්ධ රබර් බිම් ප්‍රමාණය සියයට 2 කින් අඩුවී, හෙක්ටයාර 59,560 ක් වූ අතර, පෞද්ගලික අංශය විසින් රබර් වගා කරන ලද බිම් ප්‍රමාණය හෙක්ටයාර 139,488 ක් දක්වා සුළු වශයෙන් වැඩි විය.

1990 වර්ෂයේදී කිරි කපන ලද බිම් ප්‍රමාණය සුළු වශයෙන් අඩුවී හෙක්ටයාර 146,325 විය. රාජ්‍ය සහ පෞද්ගලික යන දෙඅංශයෙහිම කිරි කපන ලද බිම් ප්‍රමාණයන්හි අඩුවීම් වාර්තා කරන ලදී. පසුගිය වර්ෂයෙහිදී මෙන් 1990 වර්ෂයේදී ද රබර් වගාව යටතේ පැවති මුළු බිම් ප්‍රමාණයෙන් කිරි කපන ලද බිම් ප්‍රමාණය සියයට 74 ක් ලෙස නොවෙනස්ව පැවතුණි.

**1 . 10 සංඛ්‍යා සටහන**

**රබර් වගා අංශය පිළිබඳ සංඛ්‍යා 1988—1990**

| ශීර්ෂය | ඒකකය | 1988 | 1989(අ) | 1990(ආ) |
|---|---|---|---|---|
| 1. නිෂ්පාදනය | කි.ග්‍රෑ. දශ ලක්ෂ | 122·4 | 110·7 | 114·0 |
| 2. බිම් ප්‍රමාණය | | | | |
| 2·1 වගාව යටතේ ඇති | හෙක්ටයාර දහස් | 200·2 | 199·6 | 199·0 |
| 2·2 කිරි කැපීම යටතේ ඇති | ,, | 145·5 | 147·3 | 146·3 |
| 3. එලදාව | හෙක්ටයාරයකට/ කි. ග්‍රෑ. | 841 | 752 | 779 |
| 4. පොහොර නිකුතුව | මෙට්‍රික් ටොන් දහස් | 25·1 | 22·6 | 21·4 |
| 5. නැවත වගා කිරීම | හෙක්ටයාර | 4,167 | 6,147 | 5,203 |
| 6. මිළ | | | | |
| 6·1 අපනයන (නැ.වී.ස.) | කි. ග්‍රෑ./රුපියල් | 37·33 | 36·18 | 35·50 |
| 6·2 කොළඹ ආර්. ඇස්. ඇස්. නො. 1 | ,, | 24·40 | 22·63 | 22·93 |
| 7. නිෂ්පාදන වියදම (ඇ) | ,, | 13·41 | 15·06 | 17·96 |
| 8. අපනයන | කි.ග්‍රෑ. දශ ලක්ෂ | 99·3 | 86·0 | 86·8 |
| 9. දේශීය පරිභෝජනය | ,, | 19·8 | 21·0 | 23·5 |
| 10. අපනයන ඉපැයීම් | රු. දශ ලක්ෂ (විගැහි දශ ලක්ෂ) | 3,705·9 (87) | 3,112·1 (67) | 3,080·2 (57) |
| 11. එකතු කළ අගය දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් වශයෙන් (ඇ) | | 1·7 | 1·6 | 1·1 |

(අ) සංශෝධිත
(ආ) තාවකාලික.
(ඇ) පෞද්ගලික අංශයේ වතුවල බර තබන ලද සාමාන්‍ය නිෂ්පාදන වියදම.
(ඈ) වගාකිරීම සහ සැකසුම් කටයුතුවල පමණි.

මූලයන් : රබර් පාලන දෙපාර්තමේන්තුව; ජාතික පොහොර ලේකම් කාර්යාලය; ශ්‍රී ලංකා මහ බැංකුව.

රබර් වගා අංශයට නිකුත් කරන ලද පොහොර ප්‍රමාණය 1990 වර්ෂයේදී සියයට එකක සුළු අඩුවීමක් දක්වමින් මෙට්‍රික් ටොන් 21,438 ක් විය. රාජ්‍ය අංශයේ වතුවල පොහොර භාවිතය 1990 දී සියයට 8 ක වැඩිවීමක් වාර්තා කර ඇත. එහෙයින්, පොහොර නිකුත් කිරීම්වල අඩුවීම සම්පූර්ණයෙන්ම පෞද්ගලික අංශයේ රබර් වගාවන්හි සිදුවූ බව පැහැදිලි වේ.

1989 වර්ෂයේදී සැළකිය යුතු වර්ධනයක් දක්වූ රබර් නැවත වගා කිරීමේ කටයුතු 1990 වර්ෂයේදී පසු බැමකට ලක් විය. එහෙයින්, නැවත වගා කරන ලද බිම් ප්‍රමාණය, 1990 දී සියයට 15 කින් අඩුවී හෙක්ටයාර 5,203 ක් විය. ජනවසම හා ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාවන් මගින් නැවත වගා කරන ලද බිම් ප්‍රමාණයන් පිළිවෙලින් හෙක්ටයාර 754 ක් හා හෙක්ටයාර 864 ක් දක්වා සියයට 31 කින් සහ සියයට 6 කින් පහත වැටුණි. පෞද්ගලික අංශය විසින් නැවත වගා කරන ලද බිම් ප්‍රමාණය සියයට 14 කින් අඩුවී හෙක්ටයාර 3,584 ක් විය. ලෝක බැංකු ආධාර ලබන දෙවැනි කුඩා රබර් ඉඩම් හිමියන් පුනරුත්ථාපනය කිරීමේ වැඩපිළිවෙල යටතේ, 1989 වර්ෂයේදී නැවත වගා කරන ලද බිම් ප්‍රමාණය හෙක්ටයාර 2,354 ක් වූ අතර, 1990 දී මෙය හෙක්ටයාර 3,015 ක් විය. කෙසේ වුවද, මෙම වැඩපිළිවෙල යටතේ 1990 දී නැවත වගා කල බිම් ප්‍රමාණය ඉලක්කගත ප්‍රමාණයන් කරා ළඟාවීමට අපොහොසත් විය. 1989 දී හෙක්ටයාර 1,335 ක් වූ අළුතින් රබර් වගා කරන ලද මුළු බිම් ප්‍රමාණය, 1990 දී සියයට 19 කින් අඩුවී හෙක්ටයාර 1,083 ක් විය. 1990 වර්ෂයේදී ජනවසම විසින් අළුතින් වගා කරන ලද බිම් ප්‍රමාණය සියයට 11 කින් අඩුවී හෙක්ටයාර 106 ක් වූ අතර, ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාවන්හි මෙම ප්‍රමාණය හෙක්ටයාර 223 සිට 1990 දී හෙක්ටයාර 152 දක්වා සියයට 32 කින් පහත වැටුණි. 1990 වර්ෂය තුළදී පෞද්ගලික අංශය විසින් අළුතින් රබර් වගා කරන ලද බිම් ප්‍රමාණය හෙක්ටයාර 168 කින් හෙවත් සියයට 17 කින් අඩුවී හෙක්ටයාර 825 ක් විය.

රාජ්‍ය සහ පෞද්ගලික යන දෙඅංශයෙහිම රබර් නිෂ්පාදන පිරිවැය 1990 දී ඉහළ නැගුණු අතර, පොහොර හා රසායනික ද්‍රව්‍ය මිල ගණන් වැඩිවීම සහ වැඩිවූ වැටුප් පිරිවැය ප්‍රධාන වශයෙන් ඊට හේතුවිය. පෞද්ගලික අංශයෙහි නිෂ්පාදන පිරිවැය 1989 දී කිලෝ ග්‍රෑමයකට රුපියල් 15.06 සිට 1990 දී කිලෝ ග්‍රෑමයකට රුපියල් 17.96 දක්වා සියයට 19 කින් වැඩිවී ඇතැයි ඇස්තමේන්තු කර ඇත.

වර්ෂය තුළදී ප්‍රධාන රබර් පරිභෝජනය කරන රටවල අඩුවූ ඉල්ලුමත්, ප්‍රධාන රබර් නිෂ්පාදනය කරන අග්නිදිග ආසියානු රටවල්වන මැලේසියාව, තායිලන්තය සහ ඉන්දුනීසියාව යන රටවල රබර් නිෂ්පාදනය වැඩිවීමත්, ජාත්‍යන්තර රබර් වෙන්දේසි මධ්‍යස්ථානවල වෙළඳ පොල තත්ත්වයන් කෙරෙහි අහිතකර බලපෑමක් ඇති කරන ලදී. කොළඹ වෙන්දේසියේදී ආර්.ඇස්.ඇස් 1 වර්ගයේ රබර් සඳහා ලැබුණු සාමාන්‍ය මිළ 1989 දී කිලෝ ග්‍රෑමයකට රුපියල් 22.63 සිට 1990 දී රුපියල් 22.93 දක්වා සුළු වශයෙන් වැඩිවිය. මෙයට වෙනස්ව යමින්, ආර්.ඇස්.ඇස්. 2 සහ ලේටෙක්ස් ක්‍රේප් 1X වර්ගයෙහි මිළ ගණන් පසුගිය වර්ෂයෙහි පැවැති මිළ ගණන් සමග සසඳා බලන විට, කිලෝ ග්‍රෑමයකට රුපියල් 21.36 සහ කිලෝ ග්‍රෑමයකට රුපියල් 28.88 දක්වා සුළු වශයෙන් පහත වැටුණි. සියළුම ශ්‍රේණිවල රබර් සඳහා ලැබුණු සාමාන්‍ය අපනයන මිල (නැ.වි.ස.), 1990 වර්ෂයේදී සියයට 2 කින් සුළු වශයෙන් අඩුවී කිලෝ ග්‍රෑමයකට රුපියල් 35.50 ක් විය.

1990 දී දේශීය රබර් පරිභෝජනය කිලෝ ග්‍රෑම් දශ ලක්ෂ 23.5 දක්වා සියයට 12 ක වැඩිවීමක් වාර්තා කරමින් මුළු රබර් නිෂ්පාදනයෙන් සියයට 21 කට දායක විය.

අඩු වූ රබර් මිල ගණන් මධ්‍යයේ සතුටුදායක නිෂ්පාදන ආන්තිකයක් සහතික කරනු වස්, 1990 සැප්තැම්බර් මාසයේදී අපනයන තීරුබද්දු අඩු කරන ලදී. ඒ අනුව, අපනයන තීරුබද්දු වල සීමා මිල 1990 සැප්තැම්බර් මාසයේදී කිලෝ ග්‍රෑමයකට රුපියල් 17 සිට කිලෝ ග්‍රෑමයකට රුපියල් 21 දක්වා වැඩි කරන ලදී.

පෞද්ගලික වතුවලට සහ කුඩා වතුහිමියනට රබර් නැවත වගා කිරීම සඳහා දෙනු ලබන සහනාධාර අනුපාතිකය 1990 වර්ෂය තුලදී හෙක්ටයාරයකට රුපියල් 32,098 සිට හෙක්ටයාර-යකට රුපියල් 37,068 ක් දක්වා වැඩි කරන ලද අතර, අළුතින් වගා කිරීම සඳහා ගෙවනු ලබන සහනාධාරය ද, හෙක්ටයාරයකට රුපියල් 30,250 සිට හෙක්ටයාරයකට රුපියල් 35,829 දක්වා ඉහළ නංවන ලදී. මෙයට අමතරව, වගා කිරීමෙන් අනතුරුව අවුරුදු 5 ක් ඇතුලත කිරි කැපීමට සුදුසු තත්ත්වයට පත්වනසේ වගාවන් නඩත්තු කරන රබර් ඉඩම් වගා කරුවනට සහනාධාර යෝජනා ක්‍රමය යටතේ හෙක්ටයාරයකට රුපියල් 2,471 ක දිරිගැන්වීමේ දීමනාවක් ද හඳුන්වා දෙන ලදී.

රබර් වගා අංශයෙහි ප්‍රතිපත්ති සම්බන්ධීකරණය සහතික කරනු වස්, රබර් කවුන්සිලය සිය වැඩකටයුතු 1990 දී අරඹන ලදී. රබර් කර්මාන්තයන්ට සම්බන්ධ සැම ආයතනයක් අතර කිට්ටු සහයෝගීතාවයක් ඇති කිරීමට අවකාශයක් ලබා දීම මෙම කවුන්සිලයෙහි ප්‍රධාන අරමුණ වේ.

**පොල්**

1989 වර්ෂයේදී සියයට 28 ක සැලකිය යුතු වර්ධනයක් වාර්තා කළ පොල් නිෂ්පාදනය, 1990 දී සියයට 2 කින් සුළු වශයෙන් වැඩි වී ගෙඩි දශ ලක්ෂ 2,523 ක් විය. පොල් වගා අංශයෙහි මෙම දුර්වල ක්‍රියාකාරිත්වය, පොල් ගස්වලට බලවත් හානි සිදු කරමින් වර්ෂයේ දෙවන හා තුන්වන කාර්තුවල පුත්තලම සහ කුරුණෑගල දිස්ත්‍රික්කවල උතුරු කොටස්වල සහ හම්බන්තොට දිස්ත්‍රික්කයෙහි පැවති දැඩි නියං කාලගුණික තත්ත්වයන්හි මූලික ප්‍රතිඵලයක් විය.

1989 වර්ෂයේ ගෙඩි දශ ලක්ෂ 597 ක් වූ පොල් තෙල් නිෂ්පාදනයේ ගෙඩි සමානය, 1990 වර්ෂයේ දී ඉතා සුළු වැඩිවීමක් වාර්තා කරමින් ගෙඩි දශ ලක්ෂ 598 ක් විය. අඩු වූ ජාත්‍යන්තර මිළ ගණන් සහ නිෂ්පාදන ආන්තිකයන් පොල් තෙල් නිෂ්පාදනය කෙරෙහි අහිතකර බලපෑමක් ඇති කළේය. මෙයට වෙනස්ව යමින්, කපාපු පොල් නිෂ්පාදනයෙහි ගෙඩි සමානය 1989 වර්ෂය හා සසඳා බලන කල සියයට 17 ක සීඝ්‍ර වර්ධනයක් වාර්තා කරමින් 1990 දී ගෙඩි දශ ලක්ෂ 374 ක් විය. ශ්‍රී ලංකාවේ කපාපු පොල් සඳහා ජාත්‍යන්තර ඉල්ලුම වැඩිවීම මීට ප්‍රධාන හේතුව විය. 1989 වර්ෂයේදී ගෙඩි දශ ලක්ෂ 41 ක් වූ කොප්පරා අපනයනයෙහි ගෙඩි සමානය, 1990 වර්ෂයේදී ගෙඩි දශ ලක්ෂ 31 දක්වා පහත වැටුණි. 1989 වර්ෂයෙහි ගෙඩි දශ ලක්ෂ 16 ක් වූ පොල් ගෙඩි අපනයන පරිමාව, 1990 දී ගෙඩි දශ ලක්ෂ 19 දක්වා ඉහළ ගියේය. 1990 වර්ෂයෙහි දේශීය අමු පොල් පරිභෝජනය පොල් ගෙඩි දශ ලක්ෂ 1,500 ක් ලෙස ඇස්තමේන්තු කර ඇති අතර, මෙය මුළු පොල් නිෂ්පාදනයෙන් සියයට 59 ක් පමණ වේ.

### 1.11 සංඛ්‍යා සටහන

### පොල් වගා අංශය පිළිබඳ සංඛ්‍යා 1988 – 1990

| ශීර්ෂය | ඒකකය | 1988 | 1989 | 1990 (අ) |
|---|---|---|---|---|
| 1. නිෂ්පාදනය (ආ) | ගෙඩි දශ ලක්ෂ | 1,936 | 2,484 | 2,523 |
| 1·1 කපාපු පොල් .. | ගෙඩි දශ ලක්ෂ (ඇ) | 155 | 319 | 374 |
| 1·2 පොල් තෙල් .. | ගෙඩි දශ ලක්ෂ (ඇ) | 276 | 597 | 598 |
| 1·3 කොප්පරා (ඈ) .. | ගෙඩි දශ ලක්ෂ (ඇ) | 29 | 41 | 31 |
| 1·4 පොල් ගෙඩි අපනයනය .. | ගෙඩි දශ ලක්ෂ | 12 | 16 | 19 |
| 1·5 දේශීය පොල් ගෙඩි පරිභෝජනය (ඉ) .. | ගෙඩි දශ ලක්ෂ | 1,449 | 1,477 | 1,500 |
| 2. සාමාන්‍ය අපනයන මිළ (නැ.වි.ස.) (ඊ) .. | ගෙඩිය/රුපියල් | 4·00 | 3·36 | 3·63 |
| 3. පොහොර නිකුතුව .. | මෙ. ටො. දහස් | 42·0 | 38·5 | 22·8 |
| 4. නිෂ්පාදන වියදම් .. | ගෙඩිය/රුපියල් | 0·81 | 0·85 | 1·11 |
| 5. නැවත වගාව/යටි වගාව (උ) .. | හෙක්ටයාර | 2,049 | 1,933 | 2,724 |
| 6. නව වගාව (උ) .. | හෙක්ටයාර | 1,153 | 1,757 | 2,042 |
| 7. අපනයන ඉපැයුම් .. | රුපියල් දශ ලක්ෂ | 1,539 | 2,865 | 2,783 |
| | (විගැහි දශ ලක්ෂ) | (36) | (62) | (51) |
| 7·1 මද ආශ්‍රිත නිෂ්පාදන .. | රුපියල් දශ ලක්ෂ | 896 | 1,920 | 1,843 |
| | (විගැහි දශ ලක්ෂ) | (21) | (42) | (34) |
| 7·2 අනෙකුත් නිෂ්පාදන .. | රුපියල් දශ ලක්ෂ | 643 | 945 | 941 |
| | (විගැහි දශ ලක්ෂ) | (15) | (20) | (17) |
| 8. එකතු කළ වටිනාකම දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් වශයෙන් (ඌ) .. | | 2·7 | 2·8 | 1·9 |

මූලයන් : පොල් වගා කිරීමේ මණ්ඩලය;
පොල් සංවර්ධන අධිකාරිය;
ජාතික පොහොර ලේකම් කාර්යාලය;
ශ්‍රී ලංකා මහ බැංකුව.

(අ) තාවකාලිකයි.

(ආ) ගණනය කරන ලද්දකි. (කොප්පරා තොග වෙනස්වීම් සඳහා ගැලපීම් කරන ලද බැවින් ශීර්ෂවල එකතුව මුළු නිෂ්පාදනය හා නොසැසඳේ.)

(ඇ) ගෙඩි ප්‍රමාණය ගණන් බැලීමේදි යොදගත් අනුපාතිකයන් :
කපාපු පොල් මෙ. ටො. 1 = ගෙඩි 6,800
පොල් තෙල් මෙ. ටො. 1 = ගෙඩි 8,000
කොප්පරා මෙ. ටො. 1 = ගෙඩි 4,925

(ඈ) අපනයන පමණි.

(ඉ) ඒකපුද්ගල ගෘහ පරිභෝජනය වසරකට ගෙඩි 90 ලෙස ගණන් බලා ඇත. කර්මාන්ත අංශයේ ප්‍රයෝජනයට ගැනෙන පොල් ගෙඩි ප්‍රමාණය මෙයට ඇතුළත් නොවේ.

(ඊ) ප්‍රධාන පොල් මද නිෂ්පාදන තුන සඳහා පමණි.

(උ) විස්තරාත්මක තොරතුරු ලබාගත නොහැකි බැවින් හෙක්ටයාර 0.4 ට අඩු කුඩා පොල් ඉඩම්වල කරගෙන යනු ලබන වගා කටයුතු පිළිබඳ විස්තර මෙයට ඇතුළත් නොවේ.

(ඌ) වගා කිරීම් සහ සැකසුම් කටයුතුවල පමණි.

1990 දී පොල් වගා අංශයට නිකුත් කළ පොහොර ප්‍රමාණය සියයට 41 කින් සීඝ්‍ර ලෙස අඩුවී මෙට්‍රික් ටොන් 22,793 ක් විය. පොහොර මිළ ගණන් වැඩිවීම, පොහොර නිකුත් කළ ප්‍රමාණය අඩුවීම කෙරෙහි ප්‍රධාන ලෙස බලපෑවේය. පොල් වගා කිරීමේ මණ්ඩලය විසින් පොහොර ගබඩා 37 ක් 1990 දී පවත්වාගෙන යන ලද අතර, පොහොර මෙට්‍රික් ටොන් 2,929 ක් බෙදා හරින ලදී. මෙය පසුගිය වර්ෂය හා සසඳා බලන කල සියයට 21 ක අඩුවීමක් පෙන්නුම් කරයි. 1989 වර්ෂයේදී පොල් පැල දශ ලක්ෂ 1.26 ක් පොල් වගාකරුවන්ට බෙදා දුන් පොල් වගා කිරීමේ මණ්ඩලය 1990 වර්ෂයේදී පොල් පැල දශ ලක්ෂ 1.23 ක් නිකුත් කරන ලදී.

විවිධ සහනාධාර ක්‍රම යටතේ සිදු කරන ලද පොල් වගා කටයුතුවල වැඩි දියුණුවක් 1990 දී දක්නට ලැබුණි. 1990 දී පුනරුත්ථාපනය කරන ලද පොල් ඉඩම් ප්‍රමාණය සියයට 3 කින් වැඩි වී හෙක්ටයාර 3,206 ක් වූ අතර, ඒ සඳහා ගෙවන ලද මුළු සහනාධාර ප්‍රමාණය සියයට 15 කින් වැඩි වී රුපියල් දශ ලක්ෂ 7 ක් විය. යටි වගාව හා නැවත වගා යටතේ වගා කරන ලද ඒකාබද්ධ බිම් ප්‍රමාණයද, සියයට 41 ක සැළකිය යුතු වැඩිවීමක් පෙන්වමින් හෙක්ටයාර 2,724 ක් විය. මේ සඳහා ගෙවන ලද මුළු සහනාධාර ප්‍රමාණය පසුගිය වර්ෂයෙහි ගෙවන ලද සහනාධාර ප්‍රමාණයට වඩා සියයට 12 ක වැඩිවීමක් පෙන්වමින් රුපියල් දශ ලක්ෂ 22 ක් විය. 1990 දී අළුතින් පොල් වගා කරන ලද බිම් ප්‍රමාණය හෙක්ටයාර 285 කින් හෙවත් සියයට 16 කින් වැඩි වී හෙක්ටයාර 2,042 ක් විය. කෙසේ වුවද, 1990 වර්ෂයේදී මේ සඳහා ගෙවන ලද මුළු සහනාධාර ප්‍රමාණය, 1989 දී රුපියල් දශ ලක්ෂ 15.5 සිට 1990 දී රුපියල් දශ ලක්ෂ 15.8 දක්වා සුළු වශයෙන් වැඩි විය. පොල් ඉඩම්වල කොකෝවා, කෝපි, ගම්මිරිස් සහ තෘණ වර්ග වැනි අතුරු බෝග වගා කරන ලද බිම් ප්‍රමාණය, 1989 දී හෙක්ටයාර 175 සිට 1990 දී හෙක්ටයාර 149 දක්වා පහත වැටුණි.

එළදාව වැඩි කාලයෙහි දී පොල් සඳහා ගොවිපලෙහි දී ලැබෙන මිළ ගණන් සහ ප්‍රධාන පොල් මද නිෂ්පාදන තුනෙහි අපනයන මිළ ගණන් සැළකිය යුතු ලෙස පහත වැටීම සීමාකිරීම සඳහා පොල් සංවර්ධන අධිකාරිය විසින් පොල් සඳහා මිළ ස්ථායිකරණ යෝජනා ක්‍රමයක් 1990 දී ක්‍රියාත්මක කළේය. සීමාසහිත බ්‍රිටිෂ් සිලෝන් කෝපරේෂන් ලංකා සමාගම මාර්ගයෙන් මෙම යෝජනාක්‍රමය ක්‍රියාත්මක කළ අතර, පොල් තෙල් මෙට්‍රික් ටොන් එකක් සඳහා රුපියල් 15,500 ක සීමා මිලක් ගෙවීමෙන් පොල් සංවර්ධන අධිකාරිය වෙළෙඳපොලට අවතීර්ණ විය. පොල් ස්ථායිකරණ අරමුදල විසින් මෙම යෝජනාක්‍රමය ක්‍රියාත්මක කිරීම සඳහා පොල් සංවර්ධන අධිකාරියට රුපියල් දශ ලක්ෂ 50 ක මුදලක් ලබා දුනි.

දැනට පවත්නා කපාපු පොල් නිෂ්පාදනය කරන කම්හල් නවීන පන්නයේ ආහාර සකස් කිරීමේ කම්හල් තත්ත්වයට උසස් කිරීම සඳහා කපාපු පොල් කම්හල් හිමියන්ට නවීන යන්ත්‍ර සූත්‍ර ආනයනය කිරීමට හැකිවනු පිණිස යෝජනා ක්‍රමයක් පොල් සංවර්ධන අධිකාරිය විසින් 1990 දී හඳුන්වා දෙන ලදී.

මූලික වශයෙන් කපාපු පොල් සඳහා ලැබුන ඉහළ මිළ ගණන් හේතුවෙන්, ප්‍රධාන පොල් මද නිෂ්පාදිත තුන සඳහා ලැබුණු සාමාන්‍ය අපනයන මිළ (නැ.වි.ඝ.) 1989 වර්ෂයේදී පොල් ගෙඩියකට රුපියල් 3.36 සිට 1990 වර්ෂයේ දී පොල් ගෙඩියකට රුපියල් 3.63 දක්වා වැඩි විය. ප්‍රධාන වශයෙන් පොහොර මිළ ගණන් වැඩිවීම සහ වැටුප් පිරිවැය වැඩිවීම හේතුවෙන්, ඇස්තමේන්තු කරන ලද සාමාන්‍ය නිෂ්පාදන වියදම 1989 දී ගෙඩියක් ශත 85 සිට 1990 දී ගෙඩියක් රුපියල් 1.11 දක්වා සියයට 31 කින් ඉහළ නැගුණි.

**වෙනත් කෘෂිකාර්මික නිෂ්පාදන**

**සුළු අපනයන බෝග**

ආර්ථිකමය වටිනාකමක් ඇති කුළුබඩු සහ පාන වර්ග හා සම්බන්ධිත බෝග වර්ග සමූහයකින් සුළු අපනයන බෝග සමන්විත වේ. මෙම බෝග බොහොමයක් ගෙවතුවල සහ කුඩා වතුවල මිශ්‍ර බෝග වශයෙන් වගා කෙරෙන බැවින්, වගාව යටතේ ඇති බිම් ප්‍රමාණය මෙන්ම නිෂ්පාදන ප්‍රමාණයන් පිළිබඳව නිවැරදි දත්ත ලබා ගැනීම අපහසු වේ. එසේ වුවද, මෙම බෝග නිෂ්පාදනයෙන් වැඩි ප්‍රමාණයක් අපනයනය කරනු ලබන බැවින්, අපනයන පරිමාවන් මෙම බෝගයන්හි නිෂ්පාදන ප්‍රමාණයන්ට ආදේශකයක් ලෙස සලකනු ලැබේ. සුළු අපනයන බෝග නිෂ්පාදනයෙන් දේශීය පරිභෝජනයට ගැනෙන ප්‍රමාණය සහ තොග වෙනස්වීම් සැළකිය යුතු තරම් නොවේයැයි මෙහිදී උපකල්පනය කරන බැවින් සුළු අපනයන බෝග නිෂ්පාදන ඇස්තමේන්තු බොහෝ දුරට දළ අගයන් වේ.

1990 වර්ෂයේදී කරාබුනැටි සහ කොකෝවා හැර අනෙකුත් වැදගත් සුළු අපනයන බෝග බොහොමයක නිෂ්පාදනයන් පසුගිය වර්ෂය හා සසඳා බලන කල සැළකිය යුතු ප්‍රමාණයකින් අඩු වී ඇති බව අපනයන දත්තයන් තුලින් පෙන්නුම් කෙරේ. 1990 වර්ෂයේදී මෙට්‍රික් ටොන් 2,137 ක් වූ කරාබු නැටි අපනයන පරිමාව, පසුගිය වර්ෂයේ අපනයන කෙරුණු මෙට්‍රික් ටොන් 312 සමග සසඳා බලන කල හය ගුණයකට වඩා වැඩිවීමක් වාර්තා කරන ලදී. කොකෝවා අපනයන පරිමාවද 1990 වර්ෂයේදී සියයට 39 කින් වැඩිවී මෙට්‍රික් ටොන් 168 ක් විය. කෙසේ වුවද, නිෂ්පාදනය සැළකිය යුතු ලෙස අඩු වූ බව හඟවමින් කරදමුංගු, සාදික්කා හා වසාවාසි, කෝපි සහ ගම්මිරිස් අපනයන පරිමාවන් පිළිවෙලින් සියයට 73 කින්, සියයට 31 කින්, සියයට 28 කින් සහ සියයට 17 කින් සැළකිය යුතු ලෙස පහත වැටුණි.

1990 වර්ෂයේදී සුළු අපනයන බෝග අංශයට නිකුත් කරන ලද පොහොර ප්‍රමාණය පසුගිය වර්ෂය හා සසඳා බලන කල සියයට 38 ක සැළකිය යුතු වැඩි වීමක් වාර්තා කරමින් මෙට්‍රික් ටොන් 7,734 ක් විය. පොහොර භාවිතයේ මෙම වැඩිවීමට දායක වූ ප්‍රධාන සාධකය පොහොර ආදර්ශ ක්‍රමය ක්‍රියාත්මක කිරීම බව පෙනේ. වර්ෂය තුළදී අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව විසින් මෙම පොහොර ආදර්ශ ක්‍රමය යටතේ සුළු අපනයන බෝග අංශයට පොහොර මෙට්‍රික් ටොන් 1,876 ක් නිකුත් කරනු ලැබීය.

අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව විසින් සපයන ලද දත්තයනට අනුව, 1990 වර්ෂයේදී සාදික්කා හැර අනෙකුත් අපනයන බෝග වර්ගයන් වගා කරන ලද බිම් ප්‍රමාණයන්හි වැඩි වීම් වාර්තා විය. 1990 වර්ෂයේදී ගම්මිරිස් වගාව යටතේ තිබුණු බිම් ප්‍රමාණය පසුගිය වර්ෂය හා සසඳා බලන කල හෙක්ටයාර 9,069 දක්වා සියයට 9 කින් සැළකිය යුතු ලෙස වැඩිවිය.

අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව සුළු අපනයන බෝග වගා කටයුතු වැඩි දියුණු කිරීම සඳහා පිහිටාධාර යෝජනා ක්‍රමයන් 1990 වර්ෂය තුළදී ද ක්‍රියාත්මක කරනු ලැබීය. 1990 වර්ෂයෙහිදී සුළු අපනයන බෝග පිහිටාධාර යෝජනා ක්‍රමය යටතේ කරන ලද වගා කටයුතුවල යම් ආකාරයක මිශ්‍ර ක්‍රියාකාරීත්වයක් දක්නට ලැබිණි. මෙම පිහිටාධාර යෝජනා ක්‍රමය යටතේ 1990 වර්ෂයේදී නැවත වගා කරන ලද බිම් ප්‍රමාණය හෙක්ටයාර 53 දක්වා සියයට 56 කින් වැඩි වූ අතර, අළුතින් වගා කරන ලද මුළු බිම් ප්‍රමාණය හෙක්ටයාර 903 දක්වා සියයට 8 කින් පහත වැටුණි. පසුගිය වර්ෂය සමඟ සසඳන කල ගම්මිරිස්, කෝපි සහ කරාබු නැටි අළුතින් වගා කරන ලද බිම් ප්‍රමාණයන් පිළිවෙලින් හෙක්ටයාර 3 කින්, හෙක්ටයාර 66 කින් සහ හෙක්ටයාර 11 කින් අඩු විය. පුනරුත්ථාපනය කරන ලද කුරුඳු සහ කොකෝවා බිම් ප්‍රමාණය පිළිවෙලින්, හෙක්ටයාර 83 ක සහ හෙක්ටයාර 15 ක අඩුවීම් වාර්තා කළේය.

ආසියානු සංවර්ධන බැංකුවේ ආධාරයෙන් 1989 වර්ෂයේ අග භාගයේ දී මූලික වැඩකටයුතු ආරම්භ කරන ලද මැද රට බහු වාර්ෂික බෝග සංවර්ධන යෝජනා ක්‍රමයේ වැඩ කටයුතු 1990 දී ආරම්භ විය. මෙම යෝජනා ක්‍රමයෙන් ගම්මිරිස්, සාදික්කා, කොකෝවා, කෝපි සහ කරදමුංගු ඇතුළු බහු වාර්ෂික බෝගයන්හි වාණිජමය නිෂ්පාදනය සහ අලෙවි පහසුකම් වැඩි දියුණු කිරීමට බලාපොරොත්තු වේ.

**වී**

1989 වර්ෂයේදී දැඩි පසු බැසීමකට ලක්වූ වී නිෂ්පාදනය 1990 දී සැලකිය යුතු ලෙස යථා තත්ත්වයට පත්විය. 1990 වර්ෂයේ වී නිෂ්පාදනය මෙට්‍රික් ටොන් දශ ලක්ෂ 2.54 (වී බුසල් දශ ලක්ෂ 122) ලෙස තාවකාලිකව ගණන් බලා ඇත. මෙය පසුගිය වර්ෂයෙහි වී නිෂ්පාදනය සමඟ සසඳා බලන කල සියයට 23 ක සැලකිය යුතු වැඩිවීමක් පෙන්වයි. කෙසේ වුවද, 1990 වර්ෂයේ වී නිෂ්පාදනය, 1985 වර්ෂයේදී වාර්තාගත වූ ඉහළම වී නිෂ්පාදනය වූ මෙට්‍රික් ටොන් දශ ලක්ෂ 2.66 ට වඩා සියයට 5 කින් අඩුය. 1989/90 මහ සහ 1990 යල යන දෙකන්නයෙහිම නිෂ්පාදනය වැඩිවීම, වී නිෂ්පාදනයෙහි මෙම වර්ධනයට දායක විය. යහපත් කාලගුණික තත්ත්වයන් පැවතීම සහ රටෙහි ආරක්ෂක තත්ත්වය යහපත් වීම හේතුවෙන් වපුරන ලද බිම් ප්‍රමාණය මෙන්ම අස්වැන්න නෙලා ගන්නා ලද බිම් ප්‍රමාණය සැලකිය යුතු ප්‍රමාණයකින් වැඩිවීමත්, සාමාන්‍ය ඵලදාව සුළු වශයෙන් වැඩිවීමත් වී නිෂ්පාදනය යථා තත්ත්වයට පත්වීමට මූලික වශයෙන් හේතුවිය.

1989/90 මහ කන්නයේ වී නිෂ්පාදනය මෙට්‍රික් ටොන් දශ ලක්ෂ 1.65 ක් (බුසල් දශ ලක්ෂ 79 ක්) ලෙස ගණන් බලා ඇති අතර, එය පසුගිය මහ කන්නයේ නිෂ්පාදනය සමඟ සසඳා බලන කල සියයට 23 ක වැඩිවීමක් දක්වයි. මෙම නිෂ්පාදන වර්ධනය ලබා කර ගැනීමට හැකි වූයේ වපුරන ලද දළ බිම් ප්‍රමාණය වැඩිවීමෙත්, සාපේක්ෂව අඩු වූ වගා හානියේත් සහ ඉහළ සාමාන්‍ය ඵලදාවේත් මූලික ප්‍රතිඵලයක් වශයෙනි. මහ කන්නයේදී මෙට්‍රික් ටොන් 73,354 ක් වන ඉහළම නිෂ්පාදන වැඩිවීම අනුරාධපුර දිස්ත්‍රික්කය විසින් වාර්තා කරන ලදී.

1990 යල කන්නයේ වී නිෂ්පාදනය මෙට්‍රික් ටොන් දශ ලක්ෂ 0.89 ක් (බුසල් දශ ලක්ෂ 43 ක්) ලෙස ගණන් බලා ඇති අතර, එය පසුගිය යල කන්නයේ නිෂ්පාදනයට වඩා සියයට 24 කින් සැලකිය යුතු ලෙස වැඩි විය. හෙක්ටයාරයක සාමාන්‍ය ඵලදාව සුළු වශයෙන් අඩු වුවද, යහපත් කාලගුණික තත්ත්වයන් නිසා වපුරන ලද සහ අස්වනු නෙලා ගන්නා ලද බිම් ප්‍රමාණයන් සැලකිය යුතු ලෙස වැඩිවීම, නිෂ්පාදනයේ මෙම වැඩිවීමට ප්‍රධාන වශයෙන් හේතු විය. කුරුණෑගල, අනුරාධපුරය, පොළොන්නරුව, අම්පාර යන දිස්ත්‍රික්කයන්හි සහ මහවැලි 'එච්' කලාපයෙහි වී නිෂ්පාදනය 1990 යල කන්නයේ මුළු නිෂ්පාදනයේ වැඩිවීමෙන් සියයට 67 කට පමණ දායක විය.

පසුගිය වර්ෂය හා සසඳන කල 1990 වර්ෂයෙහි හෙක්ටයාරයක සාමාන්‍ය ඵලදාව කිලෝ ග්‍රෑම් 3,452 ක් ලෙස ගණන් බලා ඇති අතර, එය පසුගිය වසරට වඩා සියයට 2 ක වැඩිවීමකි. පසුගිය වර්ෂයෙහි අදාල කන්න හා සසඳන කල 1989/90 මහ කන්නයේ සාමාන්‍ය ඵලදාව හෙක්ටයාරයකට කිලෝ ග්‍රෑම් 3,564 දක්වා සියයට 4 කින් වැඩිවූ අතර, 1990 යල කන්නයේදී එය හෙක්ටයාරයකට කිලෝ ග්‍රෑම් 3,265 දක්වා සුළු වශයෙන් පහත වැටුණි. උඩවලවේ ප්‍රදේශය පිළිවෙලින් පස්වන වසරටත් මහ සහ යල දෙකන්නයෙහිම ඉහළම සාමාන්‍ය ඵලදාවන් වාර්තා කරන ලදී. මහ කන්නයේදී ප්‍රධාන වාරිමාර්ග, සුළු වාරිමාර්ග සහ වර්ෂාපෝෂිත ප්‍රදේශ යන සියළුම වී වගා කරන ප්‍රදේශයන් විසින් ඉහළ සාමාන්‍ය ඵලදාවන් වාර්තා කල අතර, ප්‍රධාන වාරිමාර්ග යටතේ වූ ප්‍රදේශයන් සියයට 8 ක් වන වැඩිම ඵලදාව වාර්තා කරන ලදී. සාමාන්‍ය ඵලදාවේ මෙම වැඩිවීම, වී වගා කරන බොහෝ ප්‍රදේශයන්හි කාලගුණික තත්ත්වයන් යහපත්වීම සහ ආරක්ෂක තත්ත්වයන් පුළුල් ලෙස යථා තත්ත්වයට පත්වීම පිළිබිඹු කරයි.

## 1 . 12 සංඛ්‍යා සටහන

## වී වගා අංශය පිළිබඳ සංඛ්‍යා 1989 – 1990

| ශීර්ෂය | ඒකකය | 1989 | | | 1990(අ) | | |
|---|---|---|---|---|---|---|---|
| | | මහ | යල | එකතුව | මහ | යල | එකතුව |
| 1. දළ වශයෙන් වපුරන ලද බිම් ප්‍රමාණය .. | හෙක්ටයාර දහස් | 469 | 258 | 727 | 531 | 326 | 857 |
| 2. පොහොර නිකුතුව (ආ) .. | මෙට්‍රික් ටොන් දහස් | 105 | 51 | 156 | 98 | 46 | 144 |
| 3. දෙන ලද ණය ප්‍රමාණය .. | රුපියල් දශ ලක්ෂ | 119 | 88 | 207 | 206 | 155 | 361 |
| 4. අස්වැන්න කපාගන්නා ලද දළ බිම් ප්‍රමාණය .. | හෙක්ටයාර දහස් | 440 | 250 | 690 | 519 | 309 | 828 |
| 5. හෙක්ටයාරයක ඵලදාව (ඇ) | කිලෝග්‍රෑම් | 3,429 | 3,279 | 3,374 | 3,564 | 3,265 | 3,452 |
| 6. අස්වැන්න කපාගන්නා ලද ශුද්ධ බිම් ප්‍රමාණය .. | හෙක්ටයාර දහස් | 392 | 220 | 612 | 462 | 273 | 735 |
| 7. නිෂ්පාදනය .. | මෙට්‍රික් ටොන් දහස් | 1,342 | 721 | 2,063 | 1,647 | 891 | 2,538 |
| | (බුසල් දහස්) | (64,330) | (34,550) | (98, 880) | (78,924) | (42,681) | (121,605) |
| 8. සහතික මිළ ක්‍රමය යටතේ මිළදී ගැනීම් (ඈ) .. | මෙට්‍රික් ටොන් දහස් | 5 | — | 5 | 31 | — | 31(ඉ) |
| 9. සහල් ආනයන .. | මෙට්‍රික් ටොන් දහස් | — | — | 316 | — | — | 172 |
| (වී සමානය) .. | (මෙට්‍රික් ටොන් දහස්) | (—) | (—) | (451) | (—) | (—) | (246) |

මූලයන් : ජන ලේඛන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව;
කෘෂිකර්ම දෙපාර්තමේන්තුව;
කෘෂිකර්ම සංවර්ධන හා පර්යේෂණ අමාත්‍යාංශය;
වී අලෙවි මණ්ඩලය;
ශ්‍රී ලංකා රේගුව;
ශ්‍රී ලංකා මහ බැංකුව.

(අ) තාවකාලිකයි.

(ආ) පොහොර නිකුත් කිරීම, වගා වර්ෂය තුළදී සහ ලිත් වර්ෂය තුළදී එකිනෙකට වෙනස් වේ. වගා වර්ෂය මහ (සැප්තැම්බර්/ඔක්තෝබර්-මාර්තු/අප්‍රේල්) සහ යල (අප්‍රේල්/මැයි-අගෝස්තු/සැප්තැම්බර්) කන්න වලින් යුක්ත වේ.

(ඇ) අස්වනු කැපීමේ සමීක්ෂණයන්ගෙන් ගත් දත්තයන් පදනම් කොට ගත් ජනලේඛන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුවේ සංඛ්‍යා තොරතුරු උපයෝගි කරගෙන මහ සහ යල කන්න සඳහා වූ හෙක්ටයාරයක සාමාන්‍ය ඵලදාව ගණනය කරන ලදී. මුළු වී නිෂ්පාදනය අස්වනු නෙලා ගත් ශුද්ධ බිම් ප්‍රමාණයෙන් බෙදීමෙන් හෙක්ටයාරයක වාර්ෂික සාමාන්‍ය ඵලදාව ගණනය කරන ලදී.

(ඈ) මහ කන්නයේ අස්වැන්න ජනවාරි–ජූලි කාලච්ඡේදය තුළදී මිළදී ගත් අතර, යල කන්නයේ අස්වැන්න අගෝස්තු-දෙසැම්බර් කාලච්ඡේදය තුළදී මිළදී ගන්නා ලදී.

(ඉ) 1990 මාර්තු 23 දින සිට 1990 මැයි 7 දින දක්වා වී අලෙවි මණ්ඩලය විසින් සහතික මිලට වඩා වැඩියෙන් ගෙවා මිලට ගත්, වී ප්‍රමාණයද ඇතුළත්ය.

මහ සහ යල යන දෙකන්නයේදීම කාලගුණික තත්ත්වයන් යහපත් වීම හේතුවෙන්, 1990 වර්ෂයේදී වී වපුරන ලද දළ බිම් ප්‍රමාණය හෙක්ටයාර 856,708 දක්වා සියයට 18 කින් සැලකිය යුතු ලෙස වැඩි විය. 1989 වර්ෂයේදී දැඩි ලෙස නියඟයේ බලපෑමට හසුවූ කුරුණෑගල, අනුරාධපුරය, මන්නාරම, ත්‍රිකුණාමලය සහ මඩකලපුව යන දිස්ත්‍රික්කවල වී වපුරන ලද දළ බිම් ප්‍රමාණයන්හි, නැවත යථා තත්ත්වයට පත්වීම වඩාත් පැහැදිලිව දක්නට ලැබිණි. 1989/90 මහ සහ 1990 යල කන්නයන්හිදී වී වපුරන ලද දළ බිම් ප්‍රමාණය පිළිවෙලින් සියයට 13 කින් සහ සියයට 26 කින් සැලකිය යුතු ලෙස වැඩිවී හෙක්ටයාර 530,726 ක් සහ හෙක්ටයාර 325,982 ක් විය.

පසුගිය වර්ෂය සමඟ සසඳා බලන කළ, 1990 වර්ෂයේදී අස්වැන්න නෙලා ගන්නා ලද දළ බිම් ප්‍රමාණය සියයට 20 ක වැඩිවීමක් වාර්තා කරමින් හෙක්ටයාර 828,248 ක් විය. 1989/90 මහ සහ 1990 යල කන්නවලදී අස්වැන්න නෙලා ගන්නා ලද දළ බිම් ප්‍රමාණයන් පිළිවෙලින් සියයට 18 කින් සහ සියයට 24 කින් වැඩි විය. 1989/90 මහ කන්නයෙහි වගා හානියේ ප්‍රමාණය හෙවත් වපුරන ලද දළ බිම් ප්‍රමාණයේ හා අස්වැන්න නෙලා ගන්නා ලද දළ බිම් ප්‍රමාණයේ

වෙනස, වපුරන ලද දළ බිම් ප්‍රමාණයෙන් සියයට 2 කි. පසුගිය මහ කන්නයේදී මේ හා සැසඳෙන වගා හානි අනුපාතිකය සියයට 6 කි. මෙයට වෙනස්ව යමින්, යල කන්නයේ වගා හානියේ අනුපාතිකය පසුගිය වර්ෂයේ යල කන්නයේ වාර්තා වූ සියයට 3 ට වඩා සුළු වශයෙන් වැඩිවී සියයට 5 ක් විය. වගා හානිය සාපේක්ෂව අඩුවීමද, 1990 වර්ෂයෙහි වී නිෂ්පාදනය වැඩිවීම පැහැදිලි කරයි.

කෘෂිකාර්මික සංවර්ධන හා පර්යේෂණ අමාත්‍යාංශය විසින් 1990 වර්ෂය තුළදී වී වගා අංශයට නිකුත් කරන ලද පොහොර ප්‍රමාණය මෙට්‍රික් ටොන් 143,565 ක් ලෙස ඇස්තමේන්තු කර ඇත. මෙය පසුගිය වසරට වඩා සියයට 8 කින් තවදුරටත් පහත වැටීමක් පෙන්වයි. පොහොර නිකුත් කිරීම මහ කන්නයේදී සියයට 7 කින් පහත වැටුණු අතර, යල කන්නයේදී මෙය සියයට 10 ක අඩුවීමක් පෙන්වයි. 1990 වර්ෂය ආරම්භයේදී පොහොර සඳහා වූ සහනාධාරය ඉවත් කිරීමේ ප්‍රතිඵලයක් වශයෙන් පොහොර මිල ගණන් ඉහළයාම, යල කන්නයේ පොහොර නිකුත් කිරීම්වලට අහිතකර ලෙස බලපා ඇති බව පෙනේ. පොහොර නිකුත් කිරීම් අඩු වූ අතර, වපුරන ලද දළ බිම් ප්‍රමාණය සැලකිය යුතු ලෙස වැඩිවීම, වපුරන ලද එක් හෙක්ටයාරයක් සඳහා නිකුත් කරන ලද පොහොර ප්‍රමාණය කෙරෙහි බලපාන ලදී. 1989/90 මහ කන්නයේදී වපුරන ලද එක් හෙක්ටයාරයක් සඳහා නිකුත් කරන ලද පොහොර ප්‍රමාණය සියයට 18 කින් අඩු වූ අතර, යල කන්නයේදී එය සියයට 29 කින් සැලකිය යුතු ලෙස පහත වැටුණි.

1989 දී සියයට 95 කින් අඩු වූ වී අලෙවි මණ්ඩලයේ වී මිලදී ගැනීම, 1990 වර්ෂයේදී පසුගිය වර්ෂ හා සසඳන කල හය ගුණයකට වඩා වැඩිවීමක් පෙන්වමින් මෙට්‍රික් ටොන් 31,000 ක් විය. මිලදී ගැනීම් මෙලෙස වැඩිවීම, 1990 මාර්තු 23 දින සිට මැයි 07 දින දක්වා සහතික මිලට වඩා වැඩි තරඟකාරී මිලකට වී මිලදී ගැනීමට වී අලෙවි මණ්ඩලය විසින් තීරණය කිරීමෙහි ප්‍රතිඵලයකි. 1990 වර්ෂය තුළ වී අලෙවි මණ්ඩලය සහතික මිලට වඩා වැඩි මිලකට මිලදී ගත් වී ප්‍රමාණය වර්ෂය තුළ මිලදී ගත් මුළු වී ප්‍රමාණයෙන් සියයට 90 ක් හෙවත් මෙට්‍රික් ටොන් 28,000 ක් විය.

1990 වර්ෂයෙහි පෙබරවාරි මාසයේදී වී බුසලක සහතික මිල රුපියල් 80 සිට රුපියල් 110 දක්වා වැඩිවන ලෙස සංශෝධනය කරනු ලැබිය. 1989 වර්ෂයේ දී මෙන්ම 1990 වර්ෂයේදී ද විවෘත වෙළෙඳ පොළෙහි වී මිල ගණන් සහතික මිලට වඩා ඉහළින් පැවතුනි. කොළඹ වෙළඳ පොළෙහි සහල් කිලෝවක සාමාන්‍ය සිල්ලර මිල පසුගිය වර්ෂය සමඟ සසඳන කල කිලෝවක් රුපියල් 18.44 දක්වා සියයට 23 කින් සැළකිය යුතු ලෙස වැඩිවිය.

වී නිෂ්පාදනයේ වැඩිවීම පිළිබිඹු කරමින් පාරිභෝජනය සඳහා දේශීය වශයෙන් නිෂ්පාදනය කරනු ලැබූ සහල් (අපතේ යෑම සහ බීජ අවශ්‍යතා සඳහා වෙන් කල පසු) ප්‍රමාණය මෙට්‍රික් ටොන් දශ ලක්ෂ 1.5 ක් විය. 1989 වර්ෂයෙහි සහල් අවශ්‍යතාවයන්ගෙන් සියයට 73 ක් වූ දේශීය නිෂ්පාදනය, 1990 වර්ෂයේදී සහල් අවශ්‍යතාවයන්ගෙන් සියයට 88 කට දායක විය. දේශීය අවශ්‍යතාවයන්ගේ හිඟය සහල් ආනයනය කිරීමෙන් ප්‍රධාන වශයෙන් පියවාගනු ලැබූ අතර, 1990 වර්ෂයේදී සහල් මෙට්‍රික් ටොන් 172,000 ක් ආනයනය කරනු ලැබීය.

**සීනි**

1989 වර්ෂයේදී මෙට්‍රික් ටොන් 53,839 දක්වා සුළු වශයෙන් වැඩි වූ සීනි නිෂ්පාදනය, 1990 වර්ෂයේදී තවදුරටත් සියයට 6 වැඩිවීමක් වාර්තා කරමින් මෙට්‍රික් ටොන් 57,171 ක් විය. රටෙහි ආරක්ෂක තත්ත්වයන් සතුටුදායකවීම, ප්‍රමාණවත් වර්ෂාපතනයක් ලැබීම සහ පිට වගාකරුවන්ගේ වගා කටයුතු පුළුල්වීම, 1990 වර්ෂයේදී වැඩිවූ සීනි නිෂ්පාදනයට දායක වූ ප්‍රධාන සාධකයන් විය. නිෂ්පාදනයෙහි මෙම වර්ධනයට කන්තලේ, සෙවනගල සහ පැල්වත්ත සීනි කම්හල් එකිනෙකට වෙනස් ප්‍රමාණයන්ගෙන් දායක විය. 1989 වර්ෂයේදී සියයට 62 වැඩිවීමක් වාර්තා

කරන ලද කන්තලේ කම්හලෙහි සීනි නිෂ්පාදනය, 1990 වර්ෂයෙහිදී තවදුරටත් සියයට 3 වැඩිවීමක් දක්වමින් මෙට්‍රික් ටොන් 2,364 විය. 1989 වර්ෂයේදී සීනි නිෂ්පාදනයෙහි සියයට 19 ක අඩුවීමක් පෙන්නුම් කරන ලද සෙවනගල කම්හල, 1989 දී මෙට්‍රික් ටොන් 8,928 සිට 1990 දී මෙට්‍රික් ටොන් 9,648 දක්වා සියයට 8 ක වැඩිවීමක් වාර්තා කළේය. සෙවනගල සහ කන්තලේ කම්හල්වලට සපයනු ලැබූ උක් දඬු ප්‍රමාණය අඩු වුවත්, ප්‍රධාන වශයෙන් සීනි ලබා ගැනීමේ අනුපාතිකයන් වැඩිවීම හේතුවෙන් එම කම්හල්වල සීනි නිෂ්පාදනයන් වැඩි විය. 1989 වර්ෂයේදී සීනි නිෂ්පාදනයෙහි සියයට 5 ක අඩුවීමක් වාර්තා කරන ලද පැල්වත්ත කම්හල, 1990 වර්ෂයෙහි දී සියයට 16 ක වැඩි වීමක් වාර්තා කරමින් සීනි මෙට්‍රික් ටොන් 33,020 ක් නිෂ්පාදනය කරන ලදී. මෙම වැඩිවීමට, වගාකරුවන්ගෙන් මිළ දී ගනු ලැබූ විශාල උක් දඬු ප්‍රමාණය නිසා කම්හලෙහි මිරිකනු ලැබීම පිණිස ලැබුණු උක් දඬු ප්‍රමාණය ඉහළ යෑම හේතු විය. පසුගිය වර්ෂයෙහි මුළු සීනි නිෂ්පාදනයෙන් සියයට 53 කට දායක වූ පැල්වත්ත කම්හල, 1990 වර්ෂයේ දී ද මෙම තත්ත්වය තවදුරටත් තහවුරු කර ගනිමින් මුළු සීනි නිෂ්පාදනයෙන් තමන්ට හිමි කොටස සියයට 58 දක්වා වැඩි කර ගන්නා ලදී. නොකඩවා පිළිවෙලින් වර්ෂ තුනක දී වැඩි වූ හිඟුරාන කම්හලෙහි සීනි නිෂ්පාදනය 1990 වර්ෂයේ දී මෙට්‍රික් ටොන් 12,139 දක්වා සියයට 15 කින් පහත වැටුණි. සමහර බිම් කට්ටිකරුවන් තම ඉඩම් හැරයාම සහ ගින්නෙන් හා වන සතුන්ගෙන් වගාවට සිදු වූ හානිය හේතුවෙන් හිඟුරාන කම්හලෙහි සීනි නිෂ්පාදනය සඳහා ලැබුණු උක් දඬු සැපයුම පහත වැටීම මෙම කම්හලෙහි දුර්වල ක්‍රියාකාරිත්වයට හේතු විය.

සීමාසහිත ශ්‍රී ලංකා සීනි සමාගමෙහි කම්හල් සහ සීමාසහිත පැල්වත්ත සීනි සමාගම විසින් බිම් කට්ටිකරුවන් ද ඇතුළුව පාලනය කෙරුණු උක් වගාව යටතේ තිබූ බිම් ප්‍රමාණය (නිරි වගාව ද ඇතුළුව) සුළු වශයෙන් අඩුවී හෙක්ටයාර 10,501 විය. හිඟුරාන සහ පැල්වත්ත කම්හල් යටතේ වූ උක් වගාකරන ලද බිම් ප්‍රමාණයන් 1990 වර්ෂයෙහිදී පිළිවෙලින් හෙක්ටයාර 2,438 සහ හෙක්ටයාර 4,590 දක්වා සියයට 8 කින් සහ සියයට 2 කින් පහත වැටුණි. මෙයට වෙනස්ව යමින්, කන්තලේ සහ සෙවනගල කම්හල් යටතේ තිබූ උක් වගා කරන ලද බිම් ප්‍රමාණයන්, 1990 වර්ෂයේදී පිළිවෙලින් සියයට 12 කින් සහ සියයට 5 කින් වැඩිවී හෙක්ටයාර 1,510 සහ 1,963 විය.

සීමාසහිත ශ්‍රී ලංකා සීනි සමාගම සහ සීමාසහිත පැල්වත්ත සීනි සමාගම මගින් අස්වැන්න නෙලා ගන්නා ලද ඒකාබද්ධ මුළු බිම් ප්‍රමාණය 1990 වර්ෂයේදී සියයට 7 කින් අඩුවී හෙක්ටයාර 8,084 ක් විය. පසුගිය වර්ෂය හා සසඳා බලන කළ සෙවනගල, හිඟුරාන සහ පැල්වත්ත කම්හල් විසින් 1990 වර්ෂයෙහිදී අස්වැන්න නෙලා ගන්නා ලද බිම් ප්‍රමාණයන් පිළිවෙලින් හෙක්ටයාර 1,091, හෙක්ටයාර 2,050 සහ හෙක්ටයාර 3,899 දක්වා සියයට 24 කින්, සියයට 15 කින් හා සියයට 1 කින් පහත වැටුණි. කන්තලේ කම්හල මගින් අස්වැන්න නෙලන ලද බිම් ප්‍රමාණය, වර්ෂය තුළදී හෙක්ටයාර 1,044 දක්වා සියයට 15 කින් වැඩිවිය. 1989 වර්ෂයෙහිදී සියයට 7.84 ක් වූ සියළුම සීනි කම්හල්වල සීනි ලබාගැනීමේ සාමාන්‍ය අනුපාතිකය 1990 වර්ෂයේදී සියයට 7.52 දක්වා අඩුවිය. මෙය ප්‍රධාන වශයෙන් හිඟුරාන සහ පැල්වත්ත කම්හල්වල සීනි ලබාගැනීමේ අනුපාතිකයන් පිළිවෙලින් සියයට 6.88 සහ සියයට 7.52 දක්වා අඩුවීමේ ප්‍රතිඵලයකි. කෙසේ වුවද, කන්තලේ සහ සෙවනගල කම්හල්වල සීනි ලබාගැනීමේ අනුපාතිකයන් පිළිවෙලින් සියයට 6.60 සහ සියයට 8.91 දක්වා ඉහළ නැඟුණි.

සාමාන්‍ය අස්වැන්න පහත වැටීම මෙන්ම අස්වැන්න නෙලා ගන්නා ලද මුළු බිම් ප්‍රමාණය අඩුවීම හේතුවෙන් 1990 වර්ෂයෙහිදී සියළුම කම්හල් විසින් කපා ගන්නා ලද මුළු උක් දඬු ප්‍රමාණය සියයට 9 කින් පහත වැටී මෙට්‍රික් ටොන් 453,184 ක් විය. උක් දඬු කපා ගන්නා ලද ප්‍රමාණය අඩුවීමට කම්හල් සියල්ලම පාහේ දයක විය. 1990 වර්ෂයෙහිදී හිඟුරාන සහ සෙවනගල කම්හල් මගින් කපාගන්නා ලද උක් දඬු ප්‍රමාණයන් සියයට 9 බැගින් අඩුවූ අතර, කන්තලේ සහ පැල්වත්ත කම්හල් මගින් කපාගන්නා ලද උක් දඬු ප්‍රමාණයන් පිළිවෙලින් සියයට 6 කින් සහ සියයට 10 කින් පහත වැටුණි. කෙසේ වුවද, පසුගිය වර්ෂය හා සසඳා බලන කල 1990 වර්ෂයෙහිදී

### 1.13 සංඛ්‍යා සටහන

### සීනි නිෂ්පාදන අංශය පිළිබඳ සංඛ්‍යා 1989 - 1990

| ශීර්ෂය | ඒකකය | හිඟුරාන සීනි කම්හල | | කන්තලේ සීනි කම්හල | | සෙවනගල සීනි කම්හල | | පැල්වත්ත සීනි කම්හල | | එකතුව | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | 1989 | 1990 (ආ) | 1989 | 1990 (ආ) | 1989 | 1990 (ආ) | 1989 | 1990 (ආ) | 1989 | 1990 (ආ) |
| 1. උක් වගා කළ මුළු බිම් ප්‍රමාණය (අ) (නිරි වගාව ඇතුළුව) .. | හෙක්ටයාර | 2,644 | 2,438 | 1,345 | 1,510 | 1,868 | 1,963 | 4,700 | 4,590 | 10,557 | 10,501 |
| 2. උක් දඬු කපාගත් බිම් ප්‍රමාණය (අ) .. | හෙක්ටයාර | 2,409 | 2,050 | 906 | 1,044 | 1,440 | 1,091 | 3,944 | 3,899 | 8,699 | 8,084 |
| 3. කපාගත් උක් දඬු ප්‍රමාණය (අ) .. | මෙට්‍රික් ටොන් | 132,201 | 120,401 | 38,179 | 35,808 | 117,174 | 107,072 | 210,822 | 189,903 | 498,376 | 453,184 |
| 4. සාමාන්‍ය ඵලදාව (අ) .. | හෙක්ටයාරයකට මෙට්‍රික් ටොන් | 54·88 | 58·73 | 42·14 | 34·30 | 81·37 | 98·14 | 53·45 | 48·71 | 57·29 | 56·06 |
| 5. පෞද්ගලික අංශයෙන් මිළට ගත් උක් දඬු ප්‍රමාණය .. | මෙට්‍රික් ටොන් | 54,079 | 55,866 | — | 13 | 737 | 1,244 | 133,153 | 249,464 | 187,969 | 306,587 |
| 6. නිෂ්පාදනය කළ සීනි ප්‍රමාණය (ආහාර කොමසාරිස්ගෙන් ලබාගත් අපතේ යන සීනි වලින් කළ නිෂ්පාදන හැර) .. | මෙට්‍රික් ටොන් | 14,256 | 12,139 | 2,305 | 2,364 | 8,928 | 9,648 | 28,350 | 33,020 | 53,839 | 57,171 |
| 7. සීනි ලබා ගැනීමේ ප්‍රතිශතය .. | % | 7·65 | 6·88 | 6·04 | 6·60 | 7·57 | 8·91 | 8·24 | 7·52 | 7·84 | 7·52 |

(අ) මක්න්ද්‍රීය වගාවන් සහ බිම් කට්ටිකරුවන් සතු වගාවන් ද ඇතුලත් වේ.
(ආ) තාවකාලික.

මූලයන් : සීමාසහිත ශ්‍රී ලංකා සීනි සමාගම; සීමාසහිත පැල්වත්ත සීනි සමාගම.

පෞද්ගලික වගා කරුවන් විසින් කම්හල්වලට සපයන ලද උක් දඬු ප්‍රමාණය සියයට 63 කින් සැළකිය යුතු ලෙස වැඩිවී මෙට්‍රික් ටොන් 306,587 විය. 1990 දී පැල්වත්ත කම්හල විසින් මිළට ගන්නා ලද උක් දඬු ප්‍රමාණය සියයට 87 කින් වැඩිවී මෙට්‍රික් ටොන් 249,464 වූ අතර, එය කම්හල් හතර මගින් පෞද්ගලික වගාකරුවන්ගෙන් මිළදී ගන්නා ලද මුළු උක් දඬු ප්‍රමාණයෙන් සියයට 81 පමණ වේ.

පිට වගාකරුවන් සතු උක් වගාවන් දියුණුවීමට ඇති විශාල අවකාශය මෙන්ම, ඒවා දියුණු කිරීමට ඇති අවශ්‍යතාවය හඳුනා ගනිමින්, සෙවනගල සහ හිඟුරාන කම්හල් විසින් පවත්වා ගෙන යනු ලැබූ පිට වගාකරුවන් සඳහා වන යෝජනා ක්‍රමය තවදුරටත් පුළුල් කිරීමට පියවර ගනු ලැබීය. වර්ෂය තුළදී කන්තලේ කම්හල යටතේද පිට වගාකරුවන්ගේ යෝජනා ක්‍රමයක් ආරම්භ කිරීමට තීරණය කරන ලදී. කන්තලේ සහ හිඟුරාන කම්හල් විසින් උක්දඬුවල ගුණාත්මක සංයුතිය දක්වන සීනි ලබාගැනීමේ අනුපාතිකයන් සැළකිල්ලට ගනිමින් උක් දඬු සඳහා ගෙවන මිළ ගණන් සංශෝධනය කරන ලදී.

**අතුරු ආහාර බෝග**

වාරිමාර්ග යටතේ ඇති ප්‍රදේශයන්හි සූක්ෂම ලෙස වගා කරනු ලබන අර්තාපල්, මිරිස් සහ ළූණු වැනි වැඩි වටිනාකමින් යුත් බෝග වර්ග කිහිපයක් හැරුණු විට, අනෙකුත් අතුරු ආහාර බෝග බොහොමයක් හේන් හෝ ගෙවතුවල මිශ්‍ර වගාවන් වශයෙන් වැසි ජලයෙන් වගා කරනු ලැබේ. මෙම වගා ක්‍රමය හේතුවෙන් අතුරු ආහාර බෝග වගා කරනු ලබන බිම් ප්‍රමාණය හෝ ඒවායේ නිෂ්පාදනය පිළිබඳව විශ්වාසදායක දත්තයන් රැස්කිරීම ඉතාමත් අපහසු වී ඇත. එහෙයින්, අතුරු ආහාර බෝගවල ක්‍රියාකාරිත්වය විග්‍රහ කිරීම සඳහා භාවිතා කරන දත්තයන් තාවකාලික ඇස්තමේන්තු මත පදනම් වේ.

කෘෂිකාර්මික සංවර්ධන හා පර්යේෂණ අමාත්‍යාංශය විසින් සපයන ලද තාවකාලික දත්තයන්ට අනුව, පසුගිය වර්ෂයේදී පැවති අඩු නිෂ්පාදන මට්ටම හා සසඳා බලන කල, 1990 වර්ෂය තුල අතුරු ආහාර බෝග බොහොමයක නිෂ්පාදනය සැළකිය යුතු ප්‍රගතියක් වාර්තා කරන ලදී. 1990 වර්ෂයේදී සෝයා බෝංචි සහ තල නිෂ්පාදනය දෙගුණයකට වඩා වැඩි වූ අතර, උඳු සහ බඩ ඉරිඟු නිෂ්පාදනය පිළිවෙලින් සියයට 69 ක සහ සියයට 58 ක සැළකිය යුතු ඉහළ නැගීමක් පෙන්වීය. නිෂ්පාදනයේ මෙම තියුණු වැඩිවීමට වගා කරන ප්‍රදේශයන්හි පැවති හිතකර කාලගුණික තත්ත්වයන් සහ ආරක්ෂක තත්ත්වයන් සතුටුදායකවීමේ ප්‍රතිඵලයක් වශයෙන් වගා කරන ලද බිම් ප්‍රමාණය වැඩිවීම සහ ඉහළ නැගුණු සාමාන්‍ය ඵලදාවද ප්‍රධාන වශයෙන් හේතු සාධක විය. මූලික වශයෙන් වගා කරන ලද බිම් ප්‍රමාණය ඉහළයාම නිසා, 1990 වර්ෂයේදී මුං ඇට සහ කව්පි නිෂ්පාදනය සැළකිය යුතු ප්‍රමාණයක වැඩිවීම් වාර්තා කරන ලදී.

වැඩි වටිනාකමකින් යුක්ත අතුරු ආහාර බෝග කාණ්ඩයට අයත් වන මිරිස් සහ ලොකු ළූණු නිෂ්පාදනය 1990 වර්ෂයේදී පිළිවෙලින් සියයට 75 කින් සහ සියයට 70 කින් සැළකිය යුතු ලෙස වැඩි වූ බව වාර්තා කළ අතර, රතුළූණු සහ අර්තාපල් නිෂ්පාදනයේ අඩුවීම් දක්වීය. රතුළූණු නිෂ්පාදනයෙහි මෙම දුර්වල ක්‍රියාකාරිත්වය එම බෝගය වගා කරන ලද බිම් ප්‍රමාණය සහ සාමාන්‍ය ඵලදාව සැළකිය යුතු ලෙස පහත වැටීමේ ප්‍රතිඵලයක් විය. 1990 වර්ෂයේදී අර්තාපල් වගා කරන ලද බිම් ප්‍රමාණය වැඩි වුවද, සාමාන්‍ය ඵලදාව අඩුවීමෙන්, අර්තාපල් නිෂ්පාදනය සුළු වශයෙන් සියයට 2 කින් අඩුවිය.

කන්න දෙකෙහිදීම වැදගත් අතුරු ආහාර බෝග බොහොමයක නිෂ්පාදනයෙහි සැළකිය යුතු වැඩිවීම් වාර්තා කරන ලදී. කෙසේ වුවද, කව්පි, කුරක්කන් සහ උඳු නිෂ්පාදනය වැඩිවීම සම්පූර්ණයෙන්ම 1989/90 මහ කන්නයේදී දක්නට ලැබිණි.

## 1 . 14 සංඛ්‍යා සටහන

### අතුරු ආහාර බෝග සඳහා පදනම් මිල යෝජනා ක්‍රමය

(කිලෝ ග්‍රෑම් එකක් සඳහා රුපියල්)

| බෝගය | 1990 ජනවාරි 1 වැනිද සිට 1990 දෙසැම්බර් 31 දක්වා |
|---|---|
| බඩ ඉරිඟු .. .. .. | 4·25 |
| කුරක්කන් .. .. .. | 5·00 |
| රට කජු (පොතු සහිත) .. .. .. | 8·15 |
| සෝයා බෝංචි .. .. .. | 7·30 |
| තල | |
| කලු .. .. .. | 8·00 |
| සුදු .. .. .. | 9·90 |
| වියළි මිරිස් | |
| මිරිස් I .. .. .. | 32·00 |
| මිරිස් II .. .. .. | 30·00 |
| කව්පි .. .. .. | 9·00 |
| මුං ඇට .. .. .. | 12·00 |
| උඳු .. .. .. | 7·50 |

මූලය : කෘෂිකර්ම සංවර්ධන හා පර්යේෂණ අමාත්‍යාංශය.

පසුගිය වර්ෂ කිහිපයක පොහොර භාවිතයෙහි දක්නට ලැබුණු වැඩිවන උපනතියට වෙනස්ව යමින් අතුරු ආහාර බෝග අංශයට නිකුත් කළ පොහොර ප්‍රමාණය, 1990 වර්ෂයේදී මෙට්‍රික් ටොන් 26,971 දක්වා සියයට 6 කින් පහත වැටුණි.

1990 වර්ෂයේදී ද තෝරා ගන්නා ලද අතුරු ආහාර බෝග 9 ක් සඳහා වී අලෙවි මණ්ඩලය විසින් පදනම් මිල යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කරන ලදී. වර්ෂය තුළදී කළු පැහැති තල හැර අනෙකුත් බෝග සඳහා වූ පදනම් මිල වැඩිවන ලෙස සංශෝධනය කරන ලදී. පසුගිය වර්ෂය හා සසඳා බලන කළ, වී අලෙවි මණ්ඩලය විසින් 1990 වර්ෂයේදී බඩ ඉරිඟු සහ සෝයා බෝංචි මිළදී ගත් ප්‍රමාණයන් පිළිවෙලින් සියයට 91 කින් සහ සියයට 32 කින් අඩුවී මෙට්‍රික් ටොන් 916 ක් සහ මෙට්‍රික් ටොන් 154 ක් විය. සමුපකාර තොග වෙළෙඳ සංස්ථාව (සතොස) විසින් 1990 වර්ෂයේදී මුං ඇට මෙට්‍රික් ටොන් 1,139 ක් මිළදී ගනු ලැබිය. මෙය පසුගිය වර්ෂය හා සසඳා බලන කල තුන් ගුණයක පමණ වැඩිවීමක් පෙන්විය. සතොස මගින් දේශීය වශයෙන් මිළදී ගන්නා ලද ලොකු ළූණු ප්‍රමාණය 1990 දී මෙට්‍රික් ටොන් 92 දක්වා සියයට 93 කින් පහත වැටුණි. 1990 දී සතොස මගින් ලොකු ළූණු මෙට්‍රික් ටොන් 31,447 ආනයනය කරනු ලැබිය. මෙය 1989 වර්ෂයෙහිදී ආනයන කල ප්‍රමාණයට වඩා සියයට 32 ක වැඩිවීමකි. 1990 දී සතොස මගින් ආනයනය කරන ලද රතු පරිප්පු සහ වියළි මිරිස් ප්‍රමාණය පිළිවෙලින් මෙට්‍රික් ටොන් 33,665 ක් සහ මෙට්‍රික් ටොන් 3,488 ක් දක්වා සියයට 25 කින් සහ සියයට 45 කින් පහත වැටුණි.

### ධීවර සහ පශු නිෂ්පාදන

ධීවර සහ ජලජ සම්පත් අමාත්‍යාංශය විසින් තාවකාලිකව ගණන් බලා ඇති පරිදි, 1990 වර්ෂයේදී මුහුදු ධීවර අංශයෙහි මත්ස්‍ය නිෂ්පාදනය මෙට්‍රික් ටොන් 145,798 ක් විය. පසුගිය වර්ෂයෙහි නිෂ්පාදනය සමඟ සසඳා බලන කල, මෙය සියයට 12 කින් පමණ පහත වැටීමකි. මුහුදු ධීවර අංශයෙහි මත්ස්‍ය නිෂ්පාදනයෙන් සියයට 92 කට පමණ දායක වන වෙරළබඩ ධීවර අනු අංශයෙහි නිෂ්පාදනය සියයට 15 කින් පමණ අඩු වූ අතර, ගැඹුරු මුහුද හා දියඹ ධීවර අනු අංශයෙහි නිෂ්පාදනය සියයට 43 කින් ඉහළ නැගුණි. වෙරළබඩ ධීවර අනු අංශයෙහි මත්ස්‍ය නිෂ්පාදනය සැලකිය යුතු ලෙස පහත වැටීමට හේතු වූයේ, 1990 වසරෙහි දෙවන භාගය තුල

උතුරු සහ නැගෙනහිර පළාත්වල ධීවර කටයුතු සීමා කරමින් පැවති නොසන්සුන් තත්ත්වයන්ය. පසුගිය වර්ෂයෙහිදී මෙන්ම 1990 වර්ෂයේදී ද පෞද්ගලික අංශය, සමස්ත මත්ස්‍ය නිෂ්පාදනයෙන් විශාල කොටසකට දයක වූ අතර, ලංකා ධීවර සංස්ථාවෙහි මත්ස්‍ය සැපයුම මෙට්‍රික් ටොන් 2,000 ක් පමණක් විය.

මිරිදිය ධීවර අනු අංශය සඳහා දෙනු ලැබූ රාජ්‍ය අනුග්‍රහය අත්හිටුවීමෙන් පසුව, ධීවර සහ ජලජ සම්පත් අමාත්‍යාංශය විසින් මිරිදිය ධීවර අනු අංශයෙහි නිෂ්පාදන ක්‍රියාකාරිත්වය පිළිබඳ දත්ත රැස්කර නොමැත. කෙසේ වුවද, වර්ෂයෙහි ප්‍රථම භාගය සඳහා ලැබී ඇති දත්තවලට අනුව පසුගිය වර්ෂයෙහි ප්‍රථම භාගය සමග සසඳා බලන කල, මිරිදිය ධීවර අනු අංශයෙහි මත්ස්‍ය නිෂ්පාදනය මෙට්‍රික් ටොන් 17,866 දක්වා සියයට 8 කින් පමණ පහත වැටුණි.

1990 වර්ෂයේදී ද බටහිර වෙරළ මත්ස්‍ය සංවර්ධන ව්‍යාපෘතිය නොකඩවා ක්‍රියාත්මක කෙරුණි. නැගෙනහිර පළාතේ පැවති නොසන්සුන්තාවය හේතුවෙන් 1990 වර්ෂයේදී නැගෙනහිර වෙරළ මත්ස්‍ය සංවර්ධන ව්‍යාපෘතියේ වැඩ කටයුතු පසුබෑමකට ලක්විය. එහෙයින්, වර්ෂය තුලදී මෙම ව්‍යාපෘතිය සඳහා වැය වූ මුදල රුපියල් 95,420 ක් පමණ විය. මෙය ව්‍යාපෘතිය සඳහා වෙන්කළ මුදල් ප්‍රමාණයෙන් සියයට 48 ක් පමණි.

සංවර්ධන ක්‍රියාවලියෙහිදී ධීවර ප්‍රජාව විශාල වශයෙන් සහභාගි කරවා ගැනීම සහතික කරනු වස්, 1990 දී මුළු සාමාජිකත්වය 64,813 ක් වන ධීවර සමුපකාර සමිති 739 ක් පිහිටුවන ලදී. විවිධ සහනාධාර යෝජනා ක්‍රමයන් යටතේ වෙන් කරන ලද අරමුදල් ප්‍රයෝජනයට ගනිමින්, ධීවර සමුපකාර සමිතිවල සාමාජිකයින්ට බෝට්ටු සහ මෝටර් නිකුත් කරන ලදී. 1989 වර්ෂයෙහිදී රුපියල් දශ ලක්ෂ 14 ක් වූ මුහුදු ධීවර අංශයට දෙනු ලැබූ මුළු සහනාධාර ප්‍රමාණය, 1990 දී රුපියල් දශ ලක්ෂ 11 ක් විය. විවිධ සහනාධාර යෝජනා ක්‍රම යටතේ, මුහුදු ධීවර අංශයට බෝට්ටු 254 ක්ද, සම්ප්‍රදායික යාත්‍රා 377 ක් සහ මෝටර් 483 ක්ද නිකුත් කරන ලදී.

**1.15 සංඛ්‍යා සටහන**

**මත්ස්‍ය නිෂ්පාදනය 1986 – 1990**

මෙට්‍රික් ටොන්

| අනු අංශය | 1986 | 1987 | 1988 | 1989 | 1990 (අ) |
|---|---|---|---|---|---|
| මුහුදුබඩ .. | 144,266 | 149,278 | 155,099 | 157,411 | 134,132 |
| ගැඹුරු මුහුද හා දියඹ .. | 3,400 | 4,259 | 4,425 | 8,155 | 11,666 |
| මිරිදිය .. | 35,390 | 36,465 | 38,012 | 39,720 | ලැ.නො.(ආ) |
| එකතුව .. | 183,056 | 190,002 | 197,536 | 205,286 | 145,798(ඇ) |

මූලය : ධීවර සහ ජලජ සම්පත් අමාත්‍යාංශය.

(අ) තාවකාලික.
(ආ) මිරිදිය මසුන් නිෂ්පාදනය සඳහා දෙනු ලබන රාජ්‍ය අනුග්‍රහය 1990 ජූලි මස සිට අත්හිටුවන ලද හෙයින් මිරිදිය ධීවර අනු අංශය පිළිබඳ දත්ත ලබාගත නොහැක.
(ඇ) මිරිදිය ධීවර අනු අංශයෙහි මත්ස්‍ය නිෂ්පාදනය ඇතුළත් නොවේ.

සත්ව නිෂ්පාදනය හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව සහ ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය විසින් සතුන් ප්‍රමාණය වැඩි කිරීම, ජාතික සත්ව සහ සතුන් බෝ කිරීමේ සේවාවන් ශක්තිමත් කිරීම සඳහා අවශ්‍ය ආධාර සහ ව්‍යාප්ති සේවාවන් සැපයීම සඳහා වැඩ පිළිවෙලවල් නොකඩවා ක්‍රියාත්මක කරන ලදී. ශ්‍රී ලංකා බටහිර ජර්මන් එළවන් සංවර්ධනය කිරීමේ යෝජනා ක්‍රමයෙහි කාර්යයන් 1990 ජුනි මාසයේදී නිම කරන ලද අතර, ශ්‍රී ලංකා/ආසියානු සංවර්ධන බැංකු පශු සම්පත් සංවර්ධන යෝජනා ක්‍රමය, 1990 වසර තුලදී ද නොකඩවා ක්‍රියාත්මක විය.

ජන ලේඛන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුවේ තාවකාලික ගණන් බැලීම්වලට අනුව, 1990 දී නිෂ්පාදන කළ කිරි ප්‍රමාණය (මී කිරි ඇතුළුව) ලීටර් දශ ලක්ෂ 288 ක් වූ අතර, මෙය පසුගිය වසර සමඟ සසඳන කළ සියයට 21 ක වැඩිවීමකි. සීමාසහිත ලංකා කිරි නිෂ්පාදන සමාගම (මිල්කෝ) විසින් එකතු කරන ලද කිරි ප්‍රමාණය, පසුගිය වසරට වඩා සියයට 5 ක වැඩිවීමක් පෙන්වමින්, කිරි ලීටර් දශ ලක්ෂ 64 ක් විය. උතුරු සහ නැගෙනහිර පළාත්වල කිරි එකතු කිරීම්වල පහත වැටීම මෙම දුර්වල ක්‍රියාකාරිත්වයට මූලික වශයෙන් හේතුවිය. නිෂ්පාදන පිරිවැය වැඩිවීම සැළකිල්ලට ගනිමින් 1990 වර්ෂයෙහි ජූනි මාසයේදී මිල්කෝ සමාගම විසින්, කිරි ගැණුම් මිල ගණන් ලීටරයකට ශත 80 කින් පමණ වැඩි කරන ලදී.

ජන ලේඛන සහ සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව විසින් 1990 වර්ෂයෙහි බිත්තර නිෂ්පාදනය දශ ලක්ෂ 818 ක් ලෙස තාවකාලිකව ගණන් බලා ඇත. මෙය පසුගිය වසරෙහි නිෂ්පාදනය සමඟ සසඳන කළ සියයට 2 ක අඩුවීමක් දක්වයි.

ලැබී ඇති දත්ත අනුව, සීමාසහිත ලංකා තෙල් හා මේද සමාගමෙහි, සීමාසහිත බ්‍රිතිෂ් සිලෝන් කෝපරේෂන් ලංකා සමාගමෙහි සහ සීමාසහිත සිලෝන් ග්‍රේන් එලිවේටර්ස් සමාගමෙහි ඒකාබද්ධ සත්ව ආහාර නිෂ්පාදනය, පසුගිය වසර සමඟ සසඳන කළ සියයට 6 කින් වැඩි වී මෙට්‍රික් ටොන් 157,597 ක් විය.

**පොහොර**

1989 වර්ෂයේදී සුළු වශයෙන් සියයට 1 කින් අඩු වූ, විවිධ බෝග අංශයන් සඳහා නිකුත් කරන ලද මුළු පොහොර ප්‍රමාණය, 1990 වර්ෂයේදී මෙට්‍රික් ටොන් 429,455 දක්වා සියයට 18 කින් තියුණු ලෙස පහත වැටුණි. තේ සහ සුළු අපනයන බෝග යන වගා අංශයනට හැර අනිකුත් සියළුම බෝග වගා අංශයන් සඳහා නිකුත් කරන ලද පොහොර ප්‍රමාණයන් අඩු විය. වී වගා අංශය සඳහා නිකුත් කරන ලද පොහොර ප්‍රමාණය, මුළු පොහොර නිකුත් කිරීම් වලින් සියයට 39 ක් වන විශාලතම කොටසට දයක වුවද, එය සියයට 29 කින් සැලකිය යුතු ලෙස පහත වැටුණි. 1990 ජනවාරි මාසයේදී ඉවත් කරන ලද පොහොර සහනාධාරය සහ ඉහළ නැගුණු ජාත්‍යන්තර පොහොර මිළ ගණන් හේතුවෙන් පොහොර මිළ ගණන් වැඩිවීම පොහොර නිකුත් කිරීම්හි මෙම පහත වැටීමට ප්‍රධාන ලෙස දායක වූවා විය හැකිය.

**1.16 සංඛ්‍යා සටහන**

**බෝග අනුව පොහොර නිකුත් කිරීම 1987 – 1990**

මෙට්‍රික් ටොන් දහස්

| බෝගය | 1987 | 1988 | 1989 | 1990 (අ) |
|---|---|---|---|---|
| 1· වී .. | 217·1 | 226·2 | 238·1 | 169·2 |
| 2· තේ .. | 136·7 | 138·0 | 127·9 | 134·3 |
| 3· රබර් . | 23·2 | 25·1 | 22·6 | 21·4 |
| 4· පොල් .. | 42·2 | 42·0 | 38·5 | 22·8 |
| 5· අතුරු ආහාර බෝග .. | 22·2 | 26·1 | 28·7 | 27·0 |
| 6· සුළු අපනයන බෝග .. | 3·2 | 4·7 | 5·6 | 7·7 |
| 7· අනෙකුත් . | 60·7 | 63·1 | 60·9 | 47·1 |
| එකතුව .. | 505·3 | 525·2 | 522·3 | 429·5 |

(අ) තාවකාලික.

මූලය : ජාතික පොහොර ලේකම් කාර්යාලය.

පොහොර මිළ ගණන් ඉහළ නැගීමෙන් ගොවියනට ඇති විය හැකි අහිතකර බලපෑම අවම කිරීමේ පරමාර්ථයෙන්, 1990 වර්ෂයේදී කෘෂිකර්ම දෙපාර්තමේන්තුව විසින් වී වගාව සඳහා වන පොහොර නිර්දේශයන් ප්‍රතිශෝධනය කළ අතර, පොහොර මිශ්‍රණ භාවිතය වෙනුවට 'සෘජු' පොහොර භාවිතයට උපදෙස් දෙන ලදී.

පසුගිය වර්ෂය හා සසඳා බලන කල, 1990 වර්ෂයේදී රාජ්‍ය සහ පෞද්ගලික අංශයන් මගින් නිකුත් කරන ලද පොහොර ප්‍රමාණයන් පිළිවෙලින් සියයට 17 කින් සහ සියයට 20 කින් සැළකිය යුතු ලෙස අඩු වී මෙට්‍රික් ටොන් 348,088 ක් සහ මෙට්‍රික් ටොන් 81,367 ක් විය.

ජාතික පොහොර ලේකම් කාර්යාලයට අනුව, 1990 වර්ෂයේදී ආනයනය කරන ලද මුළු පොහොර ප්‍රමාණය මෙට්‍රික් ටොන් 507,626 ක් වූ අතර, එය 1989 වර්ෂයට වඩා සියයට 39 ක සැලකියයුතු වැඩිවීමක් වාර්තා කරන ලදී. මෙම පොහොර ආනයනයන් වැඩිවීමට සීමාසහිත කළඹු කොමර්ෂල් පොහොර සමාගම සහ සීමාසහිත ඇන්ග්ලෝ-ඒෂියන් (පොහොර) සමාගම හැර අනිකුත් සියළුම ආනයනකරුවෝ දායක වූහ.

## 1.17 සංඛ්‍යා සටහන

### පොහොර තොග නිකුතුව 1989 – 1990

| අංශය | 1989 | | 1990 (අ) | | ප්‍රමාණයෙහි වෙනස්වීම ප්‍රතිශතය |
|---|---|---|---|---|---|
| | ප්‍රමාණය (මෙ. ටොන්) | ප්‍රතිශතය | ප්‍රමාණය (මෙ. ටොන්) | ප්‍රතිශතය | |
| **1. රාජ්‍ය අංශය** | **420,926** | **81** | **348,088** | **81** | -17·3 |
| 1·1 ලංකා පොහොර සංස්ථාව .. | 232,648 | 45 | 189,770 | 44 | -18·4 |
| 1·2 ජනතා වතු සංවර්ධන මණ්ඩලය .. | 105,325 | 20 | 98,512 | 23 | -6·5 |
| 1·3 සීමාසහිත කළඹු කොමර්ෂල් පොහොර සමාගම .. | 82,953 | 16 | 59,806 | 14 | -27·9 |
| **2. පෞද්ගලික අංශය ..** | **101,386** | **19** | **81,367** | **19** | -19·7 |
| 2·1 ඒ. බවර් සහ සමාගම.. | 57,071 | 11 | 44,235 | 10 | -22·5 |
| 2·2 වෙනත් .. | 44,315 | 08 | 37,132 | 09 | -16·2 |
| එකතුව .. | 522,312 | 100 | 429,455 | 100 | -17·8 |

(අ) තාවකාලික.

මූලය : ජාතික පොහොර ලේකම් කාර්යාලය.